# 5 වැනි පරිච්ඡේදය

# විදේශීය අංශයේ ප්‍රවණතා හා ප්‍රතිපත්ති







## 5.1 සමස්ත නිරීක්ෂණ

දේශීය හා විදේශීය වශයෙන් පැන නැඟුණු නොයෙකුත් අභියෝග හමුවේ වුවද, ශ්‍රී ලංකාව විසින් පසුගිය තෙවසර තුළ ගෙවුම් ශේෂයෙහි පෙන්නුම් කළ හිතකර ප්‍රවණතාවන්, 2008 පළමු කාර්තු තුන තුළදී ද තවදුරටත් අඛණ්ඩව පෙන්නුම් කළද, ඉන්පසුව ලොවපුරා ව්‍යාප්ත වූ මූල්‍ය හා ආර්ථික අර්බුදයත් සමඟ එම හිතකර ප්‍රවණතාවයන් මුළුමනින්ම වෙනස් වන්නට විය. 2008 තුන්වන කාර්තුව අවසන් වන තුරු විදේශීය අංශයේ දර්ශක ඇතුළුව රටේ ආර්ථික මූලධර්ම ශක්තිමත් ලෙස වර්ධනය විය. අපනයන, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, ගෙවුම් ශේෂය, කෙටිකාලීන ආයෝජන සහ විදේශ සංචිත ආදී විදේශීය අංශයේ බොහෝ දර්ශක වර්ෂය මුලදී පුරෝකථනය කළ අගයන්ටත් වඩා යහපත් මට්ටමක පැවතිණි. ප්‍රධාන වෙළෙඳ පාර්ශ්වකරුවන්ගේ ආර්ථිකයන්හි සිදුවූ පසුබෑම, ඛනිජ තෙල් මිල සහ භාණ්ඩ නිෂ්පාදන වියදම ඉහළ නැගීම, සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවැති විනිමය අනුපාතය, ඉහළ පොලී අනුපාතිකය සහ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ ලැබී ඇති සහනයන් තවදුරටත් පවත්වා ගැනීම සම්බන්ධව පැවැති අවිනිශ්චිතතාව වැනි දැඩි අභියෝග මධ්‍යයේ වුවද, 2008 සැප්තැම්බර් මාසය අවසන් වන තුරු අපනයන සියයට 10 ක පමණ ප්‍රමාණයකින් වර්ධනය විය. අන්තර්ජාතික වෙළෙඳපොළෙහි ඛනිජ තෙල් හා භාණ්ඩ මිල ගණන් පෙර නොවූ විරූ පරිදි ඉහළ යාමෙන් 2008 සැප්තැම්බර් මාසය අවසන් වන විට ආනයන වියදම ඉතා විශාල ලෙස ඉහළයාම හේතුවෙන් වෙළෙඳ ගිණුමේ හිඟය සියයට 88.1 කින් පුළුල් විය. පළමු මාස නවය පුරා සියයට 20 කට වැඩි ප්‍රමාණයකින් වර්ධනය වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හේතුවෙන්, පුළුල් වූ වෙළෙඳ ගිණුමේ හිඟය ආංශික වශයෙන් සමනය කිරීමට හැකිවීම, වෙළෙඳ හිඟයෙන් ජංගම ගිණුම මත වූ බලපෑම යම්තාක් දුරකට යටපත් කිරීමට උපකාරී විය. ඒ අතරම, රජයට හා පෞද්ගලික අංශයට ගලා ආ කෙටිකාලීන විදේශීය මූල්‍ය ප්‍රවාහ, 2008 සැප්තැම්බර් මස අවසානය වන විට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,004 ක උපරිම අගයක් කරා ළඟා වූ අතර, එය එම

කාලපරිච්ඡේදයේ දී ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමෙහි අතිරික්තයක් ජනිත කිරීමට සමත් විය. මෙම අතිරික්තය ජංගම ගිණුමේ හිඟය මුළුමනින්ම මූල්‍යනය කිරීමටත් වඩා ප්‍රමාණවත් වූ හෙයින් 2008 සැප්තැම්බර් අවසාන වන විට ගෙවුම් ශේෂයෙහි එ.ජ.ඩොලර් දශ ලක්ෂ 173 ක අතිරික්තයක් වාර්තා විය.

**වසර ගෙවීයත්ම විදේශ මූල්‍ය පසුබිම සම්පූර්ණයෙන් වෙනස් වී ගෝලීය ආර්ථික වර්ධන අපේක්ෂාවන් පිරිහීයාමත් සමඟ 2008 සැප්තැම්බර් මාසය අවසන් වන තෙක් රටෙහි විදේශීය අංශය අත්කරගත් සතුටුදායක ක්‍රියාකාරිත්වය දුර්වල වීමට පටන් ගත්තේය.** ඇමෙරිකා එක්සත් ජනපදයෙහි උප-ප්‍රමුඛ උකස් වෙළෙඳපොළ මූලික කරගෙන ඇතිවූ මූල්‍ය අර්බුදය අනෙකුත් ප්‍රධාන වෙළෙඳපොළවල් කරා ද පැතිරෙමින් හටගත් ගෝලීය මූල්‍ය අර්බුදය ක්‍රමයෙන් වේගවත්ව, මූර්ත අංශයන් කරා ද ව්‍යාප්ත විය. ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු සංවර්ධිත රටවල ආර්ථික කටයුතු මන්දගාමී වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය ඉල්ලුම සැලකිය යුතු ලෙස පහළ වැටීම නිසා බලශක්තිය සහ අනෙකුත් භාණ්ඩ සඳහා වූ ඉල්ලුම ද අඩුවූ අතර, එම තත්ත්වයන් ඛනිජ තෙල් ඇතුළු අනෙකුත් භාණ්ඩවල මිල ශීඝ්‍ර ලෙස පහළ වැටීමට මඟ පෑදීය. අනපේක්ෂිත ලෙස අන්තර්ජාතික වෙළෙඳපොළෙහි භාණ්ඩ මිල ගණන් වෙනස්වීම ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු කිරීමට පමණක් නොව අපනයන ඉල්ලුම කෙරෙහිද බලපෑම් ඇති කරන ලදී. 2007 වසර සමඟ සසඳනවිට වෙළෙඳ ගිණුමේ හිඟය, සියයට 60.6 ක ඉහළයාමක් පිළිඹිබු කරමින් 2008 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,871 ක් ලෙස දැක්විණි. ගෝලීය මූල්‍ය අර්බුදය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ දැඩි ද්‍රවශීලතා හිඟය මෙන්ම, වර්ධනය වෙමින් පැවැති අවිනිශ්චිතතාවන් හමුවේ අන්තර්ජාතික වෙළෙඳාම සහ ප්‍රාග්ධන ගලා ඒම් කැපී පෙනෙන ලෙස අඩුවිය. මෙය, විදේශීය ආයෝජකයින් විසින්

**5.1 රූප සටහන — ගෙවුම් තුලනය**




**5.2 රූප සටහන — ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මූලයන්**




භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල කර ඇති ආයෝජන එකවරම ඉවත්කර ගැනීම, ලබාදී තිබූ කෙටිකාලීන ණය පහසුකම් අනපේක්ෂිත ලෙස නැවත ඉල්ලුම් කිරීම, වාණිජ්‍යමය මූල්‍ය පහසුකම්වල දැඩි හිඟය සහ එක්සත් ජනපද ඩොලරයට එරෙහිව ප්‍රධාන අන්තර්ජාතික මුදල් වර්ග තියුණු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ විදේශ සංචිත නැවත තක්සේරු කිරීමේ දී එහි වටිනාකම විශාල ලෙස අඩුවීම ආදිය සඳහා ද හේතුවිය. විදේශීය අංශයේ සිදුවූ මෙම පසුබෑම අවසාන කාර්තුවේ දී සමස්ත ගෙවුම් ශේෂය මත දැඩි පීඩනයක් ඇති කළේය. ඒ අනුව, 2008 ජූලි මාසය අවසානයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 515 ක උපරිම අගයට ළඟා වූ ගෙවුම් ශේෂයේ අතිරික්තය, 2008 අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 1.2 ක හිඟයක් බවට පරිවර්තනය වූ අතර, 2008 ජූලි මාසයේ දී එ.ජ.ඩොලර් බිලියන 3.56 ක්ව පැවැති ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත් නොවූ විදේශීය නිල සංචිත, වසර අවසාන වන විට එ.ජ.ඩොලර් බිලියන 1.75 දක්වා සියයට 50 කින් පමණ පහළ වැටුණි.

**ගෝලීය මුදල් වෙළෙඳපොළෙහි පෙර නොවූ විරූ පරිදි සිදුවූ ඉහළ උච්ඡාවචනයන් මධ්‍යයේ විනිමය අනුපාතිකය ස්ථායීව පවත්වා ගැනීම කෙරෙහි 2008 වසරේ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය වඩාත් යොමු වූ අතර, බාහිර තරගකාරීත්වය පවත්වා ගැනීම උදෙසා වසර අවසානය වන විට රුපියල ක්‍රමානුකූල ලෙස අවප්‍රමාණය වීමට ඉඩ සලසන ලදී.** 2008 පළමු සිව් මස තුළ විනිමය අනුපාතය අධිප්‍රමාණය වී ඊට පසුව එය අවප්‍රමාණය වූ අතර දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ වූ විචලනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම නිසා අඩුවිය. 2008 මැයි මාසයේ සිට බලපාන පරිදි විදේශීය ආයෝජකයින්ට රජයේ භාණ්ඩාගාර බිල්පත්වල, ඕනෑම අවස්ථාවක නොපියවා ඇති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකමින්, සියයට 10 ක ප්‍රමාණයක ආයෝජනය කිරීමට ඉඩ සැලසීම

**5.1 සංඛ්‍යා සටහන**

## ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම (අ)

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2004 | 2005 | 2006 | 2007 | 2008 (ආ) | 2004 | 2005 | 2006 | 2007 | 2008 (ආ) |
| **වෙළෙඳ ශේෂය** | **-2,243** | **-2,516** | **-3,370** | **-3,656** | **-5,871** | **-227,171** | **-253,082** | **-350,037** | **-404,703** | **-635,359** |
| අපනයන | 5,757 | 6,347 | 6,883 | 7,640 | 8,137 | 583,967 | 638,276 | 716,579 | 845,683 | 881,321 |
| ආනයන | 8,000 | 8,863 | 10,253 | 11,296 | 14,008 | 811,138 | 891,359 | 1,066,615 | 1,250,386 | 1,516,681 |
| සේවා (ශුද්ධ) | 419 | 338 | 257 | 302 | 402 | 42,735 | 34,043 | 26,660 | 33,357 | 43,680 |
| ලැබීම් | 1,527 | 1,540 | 1,625 | 1,775 | 2,003 | 154,746 | 154,877 | 168,802 | 196,249 | 217,055 |
| ගෙවීම් | 1,108 | 1,202 | 1,368 | 1,472 | 1,601 | 112,011 | 120,833 | 142,142 | 162,892 | 173,375 |
| ආදායම් (ශුද්ධ) | -204 | -299 | -389 | -358 | -972 | -20,688 | -30,049 | -40,424 | -39.054 | -105,032 |
| ලැබීම් | 157 | 35 | 311 | 449 | -32 | 15,813 | 3,629 | 32,457 | 50,213 | -3,133 |
| ගෙවීම් | 360 | 335 | 700 | 807 | 940 | 36,501 | 33,678 | 72,881 | 89,267 | 101,899 |
| **භාණ්ඩ සේවා හා ආදායම (ශුද්ධ)** | **-2,028** | **-2,478** | **-3,503** | **-3,712** | **-6,441** | **-205,124** | **-249,088** | **-363,801** | **-410,401** | **-696,712** |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 1,350 | 1,736 | 1,904 | 2,214 | 2,565 | 136,672 | 174,542 | 197,861 | 245,006 | 277,711 |
| ලැබීම් | 1,564 | 1,968 | 2,161 | 2,502 | 2,918 | 158,291 | 197,968 | 224,678 | 276,814 | 316,091 |
| ගෙවීම් | 214 | 233 | 257 | 288 | 353 | 21,619 | 23,426 | 26,817 | 31,808 | 38,380 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 30 | 93 | 101 | 97 | 101 | 3,038 | 9,300 | 10,524 | 10,677 | 10,928 |
| **ජංගම ගිණුම** | **-648** | **-650** | **-1,499** | **-1,401** | **-3,775** | **-65,414** | **-65,246** | **-155,416** | **-154,717** | **-408,073** |
| **ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම** | **631** | **1,224** | **1,808** | **2,097** | **1,773** | **60,539** | **123,866** | **190,768** | **230,978** | **193,713** |
| **ප්‍රාග්ධන ගිණුම** | **64** | **250** | **291** | **269** | **291** | **4,974** | **25,108** | **30,292** | **29,669** | **31,456** |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 64 | 250 | 291 | 269 | 291 | 4,974 | 25,108 | 30,292 | 29,669 | 31,456 |
| ලැබීම් | 71 | 257 | 299 | 278 | 303 | 5,643 | 25,863 | 31,171 | 30,735 | 32,774 |
| ගෙවීම් | 7 | 7 | 8 | 10 | 12 | 669 | 755 | 879 | 1,066 | 1,319 |
| **මූල්‍ය ගිණුම** | **567** | **974** | **1,517** | **1,828** | **1,483** | **55,565** | **98,757** | **160,477** | **201,309** | **162,258** |
| දිගුකාලීන | 680 | 798 | 907 | 1,251 | 1,016 | 69,805 | 80,391 | 95,089 | 140,054 | 109,174 |
| සෘජු ආයෝජන | 227 | 234 | 451 | 548 | 691 | 22,826 | 23,505 | 46,985 | 60,768 | 74,837 |
| විදේශීය සෘජු ආයෝජන (ශුද්ධ) | 217 | 234 | 451 | 548 | 691 | 21,948 | 23,505 | 46,985 | 60,768 | 74,837 |
| පෞද්ගලීකරණ ලැබීම් | 10 | - | - | - | - | 878 | - | - | - | - |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) | 14 | 11 | -35 | 31 | 74 | 2,270 | 1,054 | -3,590 | 3,314 | 7,768 |
| ලැබීම් | 169 | 197 | 139 | 199 | 265 | 17,503 | 19,739 | 14,469 | 22,033 | 28,693 |
| ගෙවීම් | 155 | 186 | 174 | 168 | 191 | 15,233 | 18,685 | 18,058 | 18,719 | 20,925 |
| රජයේ දිගුකාලීන (ශුද්ධ) | 439 | 553 | 491 | 672 | 252 | 44,709 | 55,832 | 51,694 | 75,971 | 26,568 |
| ලැබීම් | 771 | 747 | 932 | 1,290 | 1,059 | 78,299 | 75,309 | 97,690 | 144,146 | 114,658 |
| ගෙවීම් | 331 | 194 | 441 | 618 | 807 | 33,590 | 19,477 | 45,996 | 68,175 | 88,090 |
| කෙටිකාලීන | -112 | 176 | 610 | 577 | 466 | -14,240 | 18,366 | 65,387 | 61,256 | 53,084 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | 11 | 60 | 51 | 101 | 60 | 1,109 | 6,103 | 5,377 | 11,249 | 6,460 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) | 28 | 16 | -30 | 20 | 594 | 2,514 | 1,640 | -3,066 | 1,868 | 63,987 |
| වාණිජ බැංකු වත්කම් (ශුද්ධ) | -354 | -223 | 297 | -281 | 210 | -45,367 | -19,669 | 23,789 | -31,352 | 17,889 |
| වාණිජ බැංකු වගකීම් (ශුද්ධ) | 202 | 323 | 293 | 364 | -185 | 27,504 | 30,292 | 39,287 | 38,746 | -11,858 |
| රජයේ කෙටිකාලීන (ශුද්ධ) | - | - | - | 372 | -213 | - | - | - | 40,744 | -23,395 |
| වැරදීම් හා අත්හැරීම් | -189 | -72 | -105 | -165 | 777 | -2,599 | -10,494 | -1,830 | -16,259 | 88,137 |
| **සමස්ත ශේෂය (ඇ)** | **-205** | **501** | **204** | **531** | **-1,225** | **-7,474** | **48,125** | **33,523** | **60,002** | **-126,223** |
| මූල්‍ය වෙනස්වීම් (ඇ) | 205 | -501 | -204 | -531 | 1,225 | 7,474 | -48,125 | -33,523 | -60,002 | 126,223 |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය** | | | | | | | | | | |
| **ශ්‍රී ලංකා රු./ එ.ජ. ඩොලර්** | | | | | | **101.19** | **100.50** | **103.96** | **110.62** | **108.33** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස (ඈ)** | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | -10.9 | -10.3 | -11.9 | -11.3 | -14.4 | -10.9 | -10.3 | -11.9 | -11.3 | -14.4 |
| ජංගම ගිණුම | -3.1 | -2.7 | -5.3 | -4.3 | -9.3 | -3.1 | -2.7 | -5.3 | -4.3 | -9.3 |
| ප්‍රදානයන් හැර ජංගම ගිණුම | -3.3 | -3.0 | -5.7 | -4.6 | -9.5 | -3.3 | -3.0 | -5.7 | -4.6 | -9.5 |

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා ගෙවුම් තුලන අත්පොතේ 5 වන සංස්කරණය (1993) ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත. මීට අමතරව 1994 සිට අක්වෙරළ බැංකු ඒකකද දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා ඇත.

(ආ) තාවකාලික

(ඇ) එ.ජ.ඩොලර්වලින් දක්වා ඇති සංඛ්‍යා රුපියල් වටිනාකම්වලට පරිවර්තනය කර ඇත්තේ කාලපරිච්ඡේදයේ සාමාන්‍ය විනිමය අනුපාතිකයන්ට අනුවය.

(ඈ) දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද ද.දේ.නි. මත පදනම් වේ.

මූලික කොටගෙන, ප්‍රාග්ධන ගිණුම තවදුරටත් ලිහිල් විය. පසුගිය වසර කිහිපයක් තිස්සේ පහත වැටෙමින් පවතින ප්‍රවණතාවයන් පෙන්නුම් කළ රටෙහි මුළු විදේශ ණය, 2008 දී ද දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස පහළ වැටුණි.

## 5.2 විදේශීය අංශයෙහි ප්‍රතිපත්ති සහ ආයතනික පහසුකම්

**නිෂ්පාදන සහ වෙළෙඳපොළ අනුව අපනයන විවිධාංගීකරණ වීම මත කේන්ද්‍රගත වෙමින් රජයේ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක විය.** මේ අතරම, ඉහළ එකතු කළ අගයක් සහිත අපනයන දිරිමත් කිරීම, ඵලදායීතාව පුළුල් කරන කටයුතු දිරිමත් කිරීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඉහළ යන තරගකාරී තත්ත්වය හමුවේ ඵලදායී වෙළෙඳපොළ උපාය මාර්ග භාවිතා කිරීම සහ නව වෙළෙඳපොළවල් සොයා යෑම ආදිය තුළින් අපනයන වර්ධනය කිරීමටත් සමස්ත ආර්ථික ක්‍රියාකාරීත්වයට විදේශ වෙළෙඳාම තුළින් ඉහළ දායකත්වයක් ලබාදීමටත් බලාපොරොත්තු විය. කෙසේ වුවද අපනයන විවිධාංගීකරණ ක්‍රියාවලිය මන්දගාමී ලෙස ක්‍රියාත්මක වීම, ගෝලීය ඉල්ලුම කැපී පෙනෙන ලෙස පහත වැටීම, ද්වි-පාර්ශ්වීය හා බහු-පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් මෙන්ම වෙළෙඳ කණ්ඩායම් විශාල වශයෙන් බිහිවීම සහ අන්තර්ජාතික ප්‍රමිතීන් සහ රෙගුලාසි නිසි ලෙස පිළිපැදීමේ අවශ්‍යතාවය යනාදිය ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් පවතින විශාල අභියෝගයන් වේ.

**ලෝක වෙළෙඳපොළෙහි අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ මිලෙහි විශාල උච්චාවචනයන් මගින් දේශීය වෙළෙඳපොළේ භාණ්ඩ මිල මත වන බලපෑම අවම කිරීම සඳහා තාවකාලික පියවර ගැනීමේ අවශ්‍යතාව ඇති කළේය.** වසරේ ප්‍රථම භාගය පුරාම පැවැති උද්ධමන පීඩනය අඩුකිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක් මත තීරුබදු අහෝසි කිරීම මීට ඇතුළත් වේ. ඒ සමඟම වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වීමට පැවති පීඩනය අඩුකිරීම සඳහා අත්‍යවශ්‍ය නොවේ යැයි සැලකෙන සමහර ආනයන භාණ්ඩ මත තීරු බදු සංශෝධනය කිරීම සහ ආන්තික තැන්පතු අවශ්‍යතාවයන් ඇතිකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**2004 දී හඳුන්වාදුන් සියයට 0, 2.5, 6, 15 සහ 28 යන කොටස් පහකින් යුත් තීරු බදු ව්‍යුහය ප්‍රධාන වෙළෙඳ ප්‍රතිපත්ති නිර්නායකය ලෙස තවදුරටත් පැවැතුණි.** රේගු බදු මත අයකරන අධිභාරය 2008 දී සියයට 10 සිට 15 දක්වා ඉහළ නංවන ලදී. මේ අතර, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල ගණන් පාලනය කිරීම සඳහා තෝරාගන්නා ලද අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 11 කට රේගු බදු, එකතු කළ වටිනාකම මත වූ බදු (VAT) වරාය හා

**5.2 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය ආනයන බදු එකතු කිරීමේ අනුපාත (අ)**

| ශීර්ෂය | 2004 | 2005 | 2006 | 2007 | 2008(ආ) |
|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **10.4** | **10.4** | **11.2** | **12.4** | **6.7** |
| ආහාර හා පාන වර්ග | 8.5 | 9.6 | 10.7 | 13.5 | 6.8 |
| සහල් | 4.9 | 10.6 | 23.4 | 3.1 | 4.2 |
| පිටි | 7.2 | 3.8 | 33.7 | 31.9 | 24.3 |
| සීනි | 4.6 | 1.5 | 1.9 | 23.9 | 2.5 |
| තිරිඟු හා ධාන්‍ය | 0.1 | 1.1 | 5.6 | 6.3 | 6.3 |
| කිරි හා කිරි නිෂ්පාදන | 7.9 | 10.2 | 9.6 | 7.7 | 1.4 |
| කරවල | 5.9 | 5.9 | 5.0 | 2.9 | 2.9 |
| වෙනත් මාළු නිෂ්පාදන | 10.0 | 9.8 | 7.8 | 4.9 | 1.4 |
| වෙනත් | 17.4 | 22.0 | 24.2 | 20.8 | 14.0 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 12.2 | 11.1 | 11.7 | 11.2 | 6.5 |
| මෝටර් රථ හා යතුරු පැදි | 21.1 | 18.9 | 18.3 | 16.3 | 4.6 |
| විද්‍යුත් උපකරණ | 9.4 | 13.6 | 7.1 | 7.7 | 6.0 |
| රබර් ටයර් හා ටියුබ් | 25.8 | 26.2 | 19.2 | 22.4 | 21.5 |
| බෙහෙත් හා ඖෂධ නිෂ්පාදන | 0.6 | 0.5 | 0.3 | 0.4 | 0.4 |
| වෙනත් | 8.9 | 8.7 | 10.3 | 10.6 | 10.5 |
| **අන්තර් භාණ්ඩ** | **1.9** | **2.1** | **1.5** | **1.5** | **2.1** |
| පොහොර | 3.1 | 2.7 | 2.5 | 2.7 | 2.7 |
| බොරතෙල් | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| වෙනත් ඛනිජ තෙල් | 0.9 | 1.9 | 2.3 | 1.6 | 4.4 |
| රසායන ද්‍රව්‍ය හා සංයෝග | 2.6 | 2.0 | 1.8 | 1.9 | 1.8 |
| ඩයි වර්ග, පදම් කිරීමේ හා වර්ණ වර්ග | 4.5 | 4.4 | 2.6 | 2.5 | 2.4 |
| කඩදාසි | 6.0 | 6.0 | 2.4 | 2.2 | 1.7 |
| රෙදිපිළි | 0.0 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| වෙනත් | 4.3 | 4.5 | 3.3 | 3.3 | 3.2 |
| **ආයෝජන භාණ්ඩ** | **6.1** | **5.8** | **5.2** | **4.8** | **5.2** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 9.0 | 7.8 | 9.2 | 7.2 | 6.6 |
| ගමනාගමන උපකරණ | 11.9 | 9.7 | 7.0 | 7.1 | 12.0 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 3.2 | 3.3 | 3.2 | 2.7 | 2.4 |
| වෙනත් ආයෝජන | 5.0 | 5.3 | 3.4 | 4.2 | 4.3 |
| **සාමාන්‍ය බදු අනුපාතය** | **4.5** | **4.6** | **4.3** | **4.1** | **3.8** |

(අ) මුළු රේගු බදු එකතුව මුළු ආනයන වටිනාකමෙහි (මි. ර. ගැ.) ප්‍රතිශතයක් ලෙස

(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව

ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද (PAL) සහ සමාජ වගකීම් බද්ද (SRL) සහ අනිකුත් අයකිරීම් ඒකාබද්ධ කර ආනයන මත විශේෂ භාණ්ඩ බද්දක් (SCL) පනවන ලදී. මුළු ආනයන වටිනාකම මත අයකරන රේගු බදු අනුව ගණනය කරනු ලබන සාමාන්‍ය තීරු බදු අනුපාතය 2007 දී සියයට 4.1 ක් වූ අතර, එය 2008 දී සියයට 3.8 දක්වා අඩුවිය. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත රේගු බදු අඩුකිරීම සහ රජයේ සේවකයින්ට පෞද්ගලික මෝටර් රථ ආනයනය සඳහා තීරු ගාස්තු අඩු කිරීම මේ සඳහා විශාල වශයෙන් හේතු විය. කෙසේ වුවද, රේගු බදු අධිභාරය, එකතු කළ වටිනාකම මත වූ බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද, සමාජ වගකීම් බද්ද, සුරා බද්ද (මධ්‍යසාර, දුම්කොළ නිෂ්පාදන හා වාහන මත පනවනු ලබන), සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ මත පනවන සෙස් බද්ද යනාදී අනෙකුත් අයකිරීම් ද ආනයන මත ක්‍රියාත්මක විය. ද්විපාර්ශ්වීය සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් මගින් ප්‍රදානය කළ වරණීය තීරු බදු තුළින් විදේශ වෙළෙඳ

පරිසරය තුළ පාරදෘශ්‍යභාවය හා පුරෝකථනය කිරීමේ හැකියාව තවදුරටත් වර්ධනය කෙරිණි.

**ශ්‍රී ලංකාව ද්විපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් තුළින් වෙළෙඳපොළවලට පිවිසීමේ හැකියාව පුළුල් කරගැනීමට අඛණ්ඩව ප්‍රයත්න දරයි.** බහුපාර්ශ්වීය ගිවිසුම් සැලකූ විට දෝහා වටයේ සාකච්ඡා යටතේ එකඟතාවයකට පැමිණීම ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ප්‍රධාන අරමුණ වුව ද, 2001 සිට මේ වන තෙක් කිසිම සාර්ථක එකඟතාවකට එළඹිය නොහැකිව අවුරුදු 8 ක් ගතවී ඇත. විශාල ලෙස තීරුබදු අඩුකිරීමේ ක්‍රමවේදය හරහා කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන භාණ්ඩ වෙළෙඳපොළට පිවිසීම පිළිබඳ සාකච්ඡා යටතේ, තීරු බදු සැලකිය යුතු ලෙස අඩු කිරීම සඳහා අවධානය යොමුකරන ලදී. කෘෂිකර්මය සම්බන්ධයෙන් සැලකූ විට ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින, ශුද්ධ වශයෙන් ආහාර ආනයන කරන රටක් ලෙස මෙන්ම ජාතියක් වශයෙන් දේශීය කෘෂිකර්මයට ලබා දිය යුතු සහාය සම්බන්ධයෙන් ද තුලනාත්මකව අවධානය යොමු කළ යුතුව ඇත. කෘෂිකාර්මික නොවන වෙළෙඳපොළ පිවිසුම (NAMA) යටතේ ශ්‍රී ලංකාව තම තීරු බදු පහත හෙලීම මෙන්ම, ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල අර්ථවත් ලෙස තීරු බදු අඩු කරවීම සම්බන්ධයෙන් ද අවධානය යොමු කරමින් සිටී. මේ අනුව, තම තීරු බදු අඩුකිරීමේ එකඟතාවන් යටතේ ශ්‍රී ලංකාවේ මුළු භාණ්ඩවලින් සියයට 80 ක ප්‍රමාණයක් සාමාන්‍ය තීරු බද්ද සියයට 30 කට නොවැඩි වන සේ තබාගැනීමට ලෝක වෙළෙඳ සංවිධානය සමඟ එකඟතාවයක් ඇති කර ගත්තේය. මේ අනුව මුළු භාණ්ඩවලින් (Tariff Lines) සියයට 20 ක ප්‍රමාණයක් ඉහත සඳහන් තීරු බදු අඩුකිරීමට යටත් නොවන හෙයින් මෙම කොටස ශ්‍රී ලංකාවට අවශ්‍ය පරිදි හැසිරවීමට ප්‍රමාණවත් ප්‍රතිපත්ති අවකාශයක් ලැබී ඇත. වෙළෙඳ රීති, සේවා වෙළෙඳාම, බුද්ධිමය දේපළ සම්බන්ධ වෙළෙඳාම, වෙළෙඳ පහසුකම්, භූවිද්‍යාත්මක, සාධක ආදිය පිළිබඳ, එකඟතාවයන් පිළිබඳ 2008 දී, තවදුරටත් සාකච්ඡා කරන ලදී. ගෝලීය ආර්ථික පසුබෑමත් සමඟ රටවල් ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගවලට යොමු වේ යැයි සාමාජිකයන් තුළ පවතින සැකයත් සමඟ ලෝක වෙළෙඳ සංවිධානයේ සාකච්ඡාවලින් සාර්ථකව හා කඩිනමින් යම් එකඟතාවයකට පැමිණීමට, සාමාජිකයින්ගේ තිබෙන කැපවීම පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මෑතක සිට යුරෝපා සංගමය තුළ ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය වීමට, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ තීරු බදු රහිතව කරනු ලැබූ අපනයන උපකාරී විය.** එක්සත් රාජධානිය, ඉතාලිය, සහ බෙල්ජියම්-ලක්සම්බර්ග් යන රටවල වෙළෙඳපොළ ආයකත්වය පුළුල්වීම මෙන්ම, යුරෝපා සංගමයට කළ අපනයනවල විවිධාංගීකරණය තුළින් මෙම ක්‍රමයෙන් වූ බලපෑම පිළිබිඹු වේ. මෙතෙක් පැවැති වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය 2008 දී නිම වූ අතර එය 2009 ජනවාරි සිට තවත් අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා යම් වෙනස්කම් සහිතව නැවතත් ක්‍රියාත්මක වේ. මෙම නව ක්‍රමය යටතේ යුරෝපා සංගමයේ රටවලට තීරු බදු රහිතව භාණ්ඩ අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සුදුසුකම් ලැබුව ද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි සමහර කොන්දේසි ශ්‍රී ලංකාව විසින් ඵලදායී ලෙස ක්‍රියාවට නංවා ඇතිදැයි පරීක්ෂා කෙරෙන හෙයින් මෙම සහන තවදුරටත් නොකඩවා ලබා ගැනීම පිළිබඳ විමර්ශනයකට භාජනය වෙමින් පවතී.

**2008 වසරේ නොවැම්බර් මාසයේ සිට භාණ්ඩ වර්ග 2,700 ක බදු වරණයන් සියයට 70 සිට සියයට 100 ක් දක්වා පුළුල් කිරීමත් සමඟ, ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අවසන් තීරුබදු ලිහිල්කරණය ක්‍රියාත්මක කෙරුණි.** මේ අනුව 2000 වසරේ මාර්තු මස සිට ක්‍රියාවට නංවනු ලැබූ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ සැලසුම් කළ සියලුම කාර්යයන්, පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රධාන වශයෙන් තඹ, ඇලුමිනියම් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනවල අපනයන අඩුවීමෙන් 2008 වසරේදී ඉන්දියාවට කරන ලද අපනයන අඩුවිය. කෙසේවෙතත්, විශේෂයෙන් අනෙකුත් විශාල වෙළෙඳපොළවල් ගෝලීය අර්බුදයට ලක්වන අවස්ථාවක මෙම රටවල් දෙක අතර වෙළෙඳාමට පවතින පුළුල් ඉඩකඩ මෙනිසා අවතක්සේරුවට ලක් නොකළ යුතුය.

**ඉන්දියාව සමඟ ඇතිකරගැනීමට නියමිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) යටතේ, දෙරට අතර තීරු බදු තවදුරටත් ලිහිල් කිරීම පිළිබඳ සාකච්ඡා ඉදිරියට ගෙන යන ලදී.** දෙරටේ සංවේදී භාණ්ඩ ඇතුලත් ලැයිස්තුවේ භාණ්ඩ තවදුරටත් අඩු කරමින් සහ සේවාවන් වෙළෙඳාම අන්තර්ගත කරමින්, රටවල් දෙක අතර විශාල ආර්ථික ඒකාබද්ධතාවයක් ඇති කිරීම සඳහා ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි තවත් පියවරක් ඉදිරියට තැබීමට විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම මගින් බලාපොරොත්තු වේ. කෙසේ වෙතත්, විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමේ මූලික සාකච්ඡාවන් රටවල් දෙක මගින් අවසන් කර ඇති නමුත් වැඩිදුර උපදේශනයන් සඳහා ඇති අවශ්‍යතාවය අවධාරණය කරමින් සියළුම පාර්ශ්වකරුවන්ගේ අදහස්වලට තවදුරටත් ඉඩ සලසා දීම සඳහා අවසන් වශයෙන් එගඟතාවයකට පැමිණීමේ ක්‍රියාදාමය ප්‍රමාදවෙමින් පවතී.

**2005 ජූනි මාසයේදී ක්‍රියාවට නංවන ලද පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSLFTA) යටතේ, භාණ්ඩ හා සේවාවන් සඳහා**

පවතින වෙළෙඳ අවස්ථාවන් තවදුරටත් පුළුල් කිරීමේ අරමුණ ඇතිව, ඉන්දියාව හා සමානව පකිස්ථානය සමඟ ද විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමක් පිළිබඳව සාකච්ඡා පවත්වමින් සිටී. පකිස්ථානය සමඟ ආර්ථික සහයෝගිතා ගිවිසුම සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා වට දෙකක් අවසන් කර ඇත. මෝටර් රථ අංශයේ නිෂ්පාදන, පිරිපහදු නොකරන ලද පොල් තෙල් සහ බෝතල් ශීතකිරීමේ යන්ත්‍රවල තීරු බදු සහන පිළිබඳව පැවතුණු සමහර ගැටළු 2008 ජූනි මාසයේදී නිරාකරණය කරගන්නා ලදී.

පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක වීමට පෙර පැවැති වෙළෙඳාම හා සැසඳීමේ දී 2008 දී ශ්‍රී ලංකාවෙන් පකිස්ථානයට කළ අපනයන සියයට 81 කින් ද පකිස්ථානයෙන් කරන ලද ආනයන සියයට 78 කින් ද සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. වරණීය සහන සියයට 40 සිට සියයට 60 දක්වා පුළුල් කරමින් ශ්‍රී ලංකාව විසින් සිදු කළ හතරවන තීරුබදු ලිහිල්කරණය 2008 නොවැම්බර් මාසයේදී ක්‍රියාත්මක කරන ලදී. පකිස්ථානය ඔවුන්ගේ අවසන් තීරුබදු අඩුකිරීමේ එකඟතාවය ක්‍රියාත්මක කළ විට ශ්‍රී ලංකාවේ

**5.3 සංඛ්‍යා සටහන** — **වෙළෙඳ දර්ශක (අ)**

| ශීර්ෂය | 2007 (ආ) | | | 2008 (ඇ) | | | වර්ධන වේගය (ඇ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **141.9** | **125.9** | **112.7** | **174.6** | **130.3** | **134.0** | **23.1** | **3.5** | **18.9** |
| තේ | 142.2 | 122.1 | 116.5 | 176.4 | 125.4 | 140.7 | 24.0 | 2.7 | 20.8 |
| රබර් | 139.0 | 85.8 | 162.1 | 159.0 | 80.7 | 196.9 | 14.4 | -5.9 | 21.5 |
| පොල් | 120.0 | 124.1 | 96.7 | 145.4 | 123.0 | 118.2 | 21.1 | -0.9 | 22.2 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 159.7 | 167.9 | 95.1 | 198.1 | 187.8 | 105.5 | 24.1 | 11.9 | 10.9 |
| **කාර්මික අපනයන** | **173.3** | **163.0** | **106.4** | **178.9** | **162.3** | **110.2** | **3.2** | **-0.4** | **3.6** |
| රෙදිපිළි හා ඇඟළුම් | 146.5 | 150.8 | 97.2 | 152.2 | 154.6 | 98.4 | 3.9 | 2.5 | 1.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 173.5 | 57.5 | 301.7 | 261.7 | 62.9 | 416.1 | 50.9 | 9.4 | 37.9 |
| වෙනත් | 230.6 | 198.6 | 116.1 | 228.4 | 187.9 | 121.6 | -0.9 | -5.4 | 4.7 |
| **ඛනිජ ද්‍රව්‍ය අපනයන** | **143.1** | **135.0** | **106.0** | **137.0** | **134.2** | **102.1** | **-4.2** | **-0.6** | **-3.7** |
| මැණික් | 127.0 | 126.3 | 100.6 | 121.7 | 124.3 | 97.9 | -4.2 | -1.6 | -2.7 |
| වෙනත් | 354.3 | 249.5 | 142.0 | 338.6 | 264.3 | 128.1 | -4.4 | 5.9 | -9.8 |
| **මුළු අපනයන** | **164.4** | **153.8** | **106.8** | **175.1** | **154.4** | **113.4** | **6.5** | **0.3** | **6.1** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **163.1** | **167.2** | **97.6** | **200.6** | **195.3** | **102.7** | **23.0** | **16.8** | **5.3** |
| ආහාර හා පාන වර්ග | 129.4 | 116.8 | 110.8 | 176.0 | 157.2 | 111.9 | 36.0 | 34.6 | 1.0 |
| වෙනත් | 212.1 | 240.4 | 88.2 | 236.3 | 250.6 | 94.3 | 11.4 | 4.2 | 6.9 |
| **අන්තර් භාණ්ඩ** | **208.7** | **147.5** | **141.5** | **269.4** | **154.2** | **174.7** | **29.1** | **4.6** | **23.4** |
| පොහොර | 290.0 | 145.8 | 199.0 | 868.6 | 197.8 | 439.2 | 199.5 | 35.7 | 120.8 |
| බොර තෙල් | 388.1 | 106.8 | 363.5 | 500.9 | 102.3 | 489.7 | 29.1 | -4.2 | 34.7 |
| අනෙකුත් ඛනිජ තෙල් | 535.9 | 187.4 | 286.0 | 742.7 | 202.3 | 367.2 | 38.6 | 7.9 | 28.4 |
| රසායනික ද්‍රව්‍ය සහ සංයෝග | 206.9 | 154.4 | 134.0 | 265.5 | 181.3 | 146.5 | 28.3 | 17.4 | 9.3 |
| තිරිඟු සහ ධාන්‍ය | 169.8 | 120.6 | 140.7 | 272.5 | 116.4 | 234.0 | 60.5 | -3.5 | 66.3 |
| රෙදිපිළි | 117.7 | 138.7 | 84.8 | 122.7 | 143.6 | 85.4 | 4.3 | 3.5 | 0.7 |
| ප්ලාස්ටික් | 249.9 | 184.5 | 135.4 | 257.0 | 180.3 | 142.5 | 2.8 | -2.3 | 5.2 |
| දියමන්ති | 172.6 | 103.4 | 167.0 | 287.4 | 128.2 | 224.2 | 66.5 | 24.0 | 34.3 |
| වෙනත් | 197.4 | 195.9 | 100.8 | 216.5 | 196.3 | 110.3 | 9.6 | 0.2 | 9.4 |
| **ආයෝජන භාණ්ඩ** | **202.5** | **225.3** | **89.9** | **224.6** | **217.9** | **103.1** | **10.9** | **-3.3** | **14.7** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 287.2 | 259.9 | 110.5 | 342.8 | 260.1 | 131.8 | 19.4 | 0.1 | 19.3 |
| ප්‍රවාහන උපකරණ | 175.2 | 99.5 | 176.0 | 195.5 | 99.2 | 197.0 | 11.6 | -0.3 | 12.0 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 167.7 | 257.3 | 65.2 | 175.9 | 244.6 | 71.9 | 4.9 | -4.9 | 10.3 |
| වෙනත් | 285.2 | 157.4 | 181.2 | 323.4 | 154.3 | 209.6 | 13.4 | -1.9 | 15.6 |
| **මුළු ආනයන** | **192.6** | **169.5** | **113.6** | **238.8** | **177.1** | **134.9** | **24.0** | **4.4** | **18.7** |
| **වෙළෙඳ අනුපාතය** | | | **94.0** | | | **84.1** | | | **-10.6** |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන 4,500 කට තීරුබදු රහිතව පකිස්ථානයට අපනයනය කිරීමට හැකි වනු ඇත.

**ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ පවත්නා වෙළෙඳ හා ආයෝජන කෙටුම්පත් ගිවිසුම (TIFA) රටවල් දෙක අතර සමීප සහයෝගිතාවයකට අනුබල ලබාදීම සඳහා ප්‍රයෝජනවත් ආයතනික සැකසුමක් සපයනු ලබයි.** එමගින් රටවල් දෙක අතර වෙළෙඳාම අවහිරවන ඕනෑම බාධකයක් හඳුනාගැනීමට සහ ඒ වෙනුවෙන් නිරතුරු ක්‍රියා කිරීමට දෙරටේ බලධාරීන් අවශ්‍ය පසුබිම සලසා ගනු ලැබේ. අමාත්‍ය මට්ටමේ වාර්ෂික උපදේශනාත්මක රැස්වීමක් 2008 වසරේ මැයි මාසයේදී වොෂින්ටන්වලදී පැවැත්වුනු අතර, මෙහිදී ඇමෙරිකා එක්සත් ජනපදයට කරන අපනයන සඳහා, විශේෂයෙන් ඇඟළුම් සඳහා වෙළෙඳපොළ පුළුල් කර ගැනීම සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ සහයෝගීතාවය ලබාගැනීම කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමුකරන ලදී.

**අසල්වාසී රටවල් සමඟ පවතින සාම්ප්‍රදායික වෙළෙඳ බැඳීම් ශක්තිමත් කරගැනීමේ අරමුණින් කලාපීය වෙළෙඳ සාකච්ඡා සඳහා ශ්‍රී ලංකාව ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස අඛණ්ඩව සහයෝගීතාවය දැක්වීය.** මේ අනුව සාමාජික රටවල් අතර වෙළෙඳාමේ ඒකාබද්ධතාවය අර්ථාන්විතවීම සහතික කරගැනීම සඳහා දකුණු ආසියා වෙළෙඳ ගිවිසුම (SAFTA), ආසියා -ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA), බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය උදෙසා වන බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලිකත්වය (BIMST-EC) සහ කලාපීය සහයෝගිත්වය සඳහා ඉන්දීය සාගර කවය සංවිධානය (IOR-ARC) යනාදිය යටතේ සාකච්ඡා පැවැත්වීම මීට ඇතුළත් විය. තවද ඉරානය සහ චීනය සමඟ වෙළෙඳාම සහ ආර්ථික සහයෝගීතාවය වැඩිදියුණු කරගැනීම සඳහා සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියෙහි ද නියුක්තව සිටී.

**රජයේ දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුව මගින් ප්‍රකාශයට පත්කර ඇති සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම උදෙසා රජය සහ අනෙකුත් ආයතන ගන්නා ලද ක්‍රියාමාර්ගයන් සමස්ත වෙළෙඳාම කෙරෙහි යම් බලපෑමක් ඇති කර ඇත.** වරාය සංවර්ධනය විදුලි බලාගාර, ජල සම්පාදන ව්‍යාපෘති සහ ජල සම්පත් යෝජනා ක්‍රම, ප්‍රාදේශීය විදුලිබල යෝජනා ක්‍රම වැනි විශාල පරිමාණයේ ව්‍යාපෘති සහ පොහොර සහනාධාර වැඩසටහන් ක්‍රියාවට නැංවීම මගින් ආයෝජන සහ අන්තර් භාණ්ඩ ආනයන පරිමාව ඉහළ නැංවුණු අතර, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල ගණන්වල විශාල උච්චාවචනයන් හමුවේ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට ගත් සමහර ක්‍රියාමාර්ග ආනයන පරිමාව වැඩි වීම යම්තාක් දුරකට අඩු කරන ලදී. 2008 වසරේ දී අපනයන සංවර්ධන වැඩසටහන් මාලාවක් අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් ක්‍රියාත්මක කරන ලදී. ඉහළ එකතුකළ අගයක් සහිත තත්ත්වයෙන් උසස් කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන වෙළෙඳපොළට සැපයීම සහ ග්‍රාමීය ප්‍රදේශවල ගොවීන්ගේ මැදිහත් වීමෙන් අපනයන කලාප ස්ථාපිත කිරීම, යනාදියෙන් අපනයන මගින් උත්පාදනය වන ලාභාංශ විශාල ජන කොටසක් අතර බෙදී යාමට සැලැස්වීමට උත්සාහ ගැනීම ආදිය අපනයන සංවර්ධන මණ්ඩලය අරඹන ලද ප්‍රධාන වැඩසටහන් අතර විය. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබා ගැනීම උදෙසා අපනයනකරුවන්ට සහාය වීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) සමඟ එක්ව කාබනික පොහොර යෙදූ කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය සහ සැකසීම සඳහා ශ්‍රී ලංකා තත්ත්ව සහතිකයක් හඳුන්වාදෙන ලදී. එසේම වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධාවන් ඉවත් කරමින් සහ කලාපය තුළ භාණ්ඩ හා සේවාවන් පහසුවෙන් හුවමාරු වීමට පහසුකම් සැලසීමේ අරමුණෙන් සාර්ක් රටවල ප්‍රමිතීන් අතර යම් එකඟතාවයක් ඇතිකිරීම සඳහා දකුණු ආසියාතික කලාපීය ප්‍රමිති ආයතනයක් ස්ථාපිත කිරීම සම්බන්ධ කාර්යයන්හි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඉතා උද්යෝගිමත්ව සහභාගි විය.

### 5.3 භාණ්ඩ වෙළෙඳාම, වෙළෙඳ ශේෂය සහ වෙළෙඳ අනුපාතය

#### අපනයන ක්‍රියාකාරිත්වය

**2007 වසරේ දී එ. ජ.ඩොලර් දශ ලක්ෂ 7,640 ක් වූ අපනයන ආදායම 2008 වසරේදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8,137 දක්වා සියයට 6.5 කින් වර්ධනය විය.** 2008 වසරේ පළමු මාස අට තුළදී සියයට 12.7 ක සතුටුදායී වර්ධනයක් පෙන්නුම් කළ අපනයන, අවසාන කාර්තුවේ දී ජාත්‍යන්තර ඉල්ලුම පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2008 වසර අවසානය වන විට වර්ධන වේගය සියයට 6.5 ක් දක්වා අඩු විය. 2008 වසරේදී කෘෂිකාර්මික අංශය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,855 දක්වා සියයට 23.1 කින් වර්ධනය වෙමින් සමස්ත අපනයන වර්ධනය සඳහා දායක වූ ප්‍රධාන බලවේගය විය. අපනයන වර්ධනය සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන සියයට 70 කට ආසන්න දායකත්වයක් ලබාදෙන ලද අතර, අන්තර්ජාතික වෙළෙඳපොළෙහි ආකර්ෂණීය මිල ගණන් ලැබීම මේ සඳහා විශාල වශයෙන් හේතු විය.

**තේ සඳහා වූ ඉහළ මිල ගණන් හේතුවෙන් 2008 වසරේදී තේ අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,271 ක් ලෙස වාර්තා කරමින් කෘෂිකාර්මික අපනයන සඳහා මූලිකත්වය සපයන ලදී.** කෙන්යාවේ තේ නිෂ්පාදනය සඳහා පැවැති අවිනිශ්චිතතාවන් හමුවේ එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ අනෙකුත් මැදපෙරදිග

**5.3 රූප සටහන** **භාණ්ඩ අනුව අපනයන**




රටවලින් ඉල්ලුම ඉහළයාම තුළින් 2008 පළමු මාස නවය තුළදී ශ්‍රී ලංකාවේ තේ අපනයන මිල ගණන් වාර්තාගත අගයන් කරා ළඟා විය. මැද පෙරදිග සහ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්, 2008 වසරේ ශ්‍රී ලංකාවේ තේ අපනයන සඳහා විශාලතම වෙළෙඳපොළවල් වූ අතර දායකත්වය පිළිවෙලින් සියයට 46 ක් සහ සියයට 23 ක් විය.

**ගෝලීය මූල්‍ය අර්බුදයෙහි බලපෑම තීව්‍ර වීමත් සමඟ සැප්තැම්බර් මාසයේ තුන්වන සතියේ සිට කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් විශාල ලෙස පහළ යන ලදී.** තේ මිල ගණන් තවදුරටත් අඩු වෙතැයි අපේක්ෂාවෙන් වෙළෙඳුන් තේ මිලදී ගැනීම පමා කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මෙම තත්ත්වය තවත් අයහපත් වීමට හේතු විය. එසේම, පළමු කාර්තු තුන තුළදී පැවති ඉහළ මිල ගණන් සමග වෙන්දේසියට ඉදිරිපත් කරන ප්‍රමාණය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් යුතුව නිෂ්පාදකයින් තත්ත්වයෙන් බාල තේ වෙන්දේසියට ඉදිරිපත් කිරීමට පෙළඹීමෙහි ප්‍රතිඵලයක් ලෙස වෙන්දේසියෙහි විකුණන ලද තේවල ගුණාත්මකභාවය ද පිරිහීමට ලක්විය. එසේම තේ මිල ගණන් තවදුරටත් අඛණ්ඩව පහළ වැටීමත් සමග තේ දළු සපයන්නන්ට හා නිෂ්පාදකයින්ට එම මිල තම වියදම් පියවා ගැනීමටවත් ප්‍රමාණවත් නොවන තත්ත්වයන් උදා වූ අතර, සමහර තේ තොග කොළඹ තේ වෙන්දේසියේ අලෙවි නොවී ඉතිරි විය. අලෙවි නොවුණු තේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය හරහා මිලදී ගනිමින්, තේ වෙළෙඳපොළෙහි මිල ගණන් ස්ථාවර තත්ත්වයකට පත්කිරීම සඳහා රජයට මැදිහත් වීමට සිදු විය. පසුව තේ මිල යථා තත්ත්වයට පත්වීමත් සමඟ 2009 ජනවාරි මාසයේ සිට එම මිලදී ගත් තේ වෙන්දේසියේදී නැවත අලෙවිකරන ලදී. කෙසේ වුවද, කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් වසර අවසානයේ තවදුරටත් පහළ ගියද, එම මිල ගණන් ලොවපුරා පැවැති අනෙකුත් ප්‍රධාන වෙන්දේසි මධ්‍යස්ථානවල මිල ගණන්වලට වඩා ඉහළින් පැවතුණි. "සිලෝන් ටී" හා බැඳුනු ඉහළ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ස්ථාපනය කර තිබූ ඉහළ ප්‍රමිතීන් තේ දළු සපයන්නන් මෙන්ම තේ නිෂ්පාදනකරුවන් විසින් පිළිපදින්නේද යන්න සොයා බැලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**සුළු කෘෂිකාර්මික අපනයන, 2008 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 287 ක් උත්පාදනය කරමින්, රටෙහි අපනයන ආදායමෙහි වැදගත් ප්‍රභවයක් බවට පත්වෙමින් තිබේ.** මිල සහ ප්‍රමාණය යන දෙකෙහිම ඉහළයාම පිළිඹිබු කරමින් පළතුරු, එළවළු සහ කරාබුනැටි වැනි කුළුබඩු වර්ගවලින් සමන්විත සුළු කෘෂිකාර්මික නිෂ්පාදන 2008 වසරේදී සිත්ගන්නා සුළු වර්ධනයක් වාර්තා කළේය. එසේම, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවතුණු ඉහළ මිල ගණන් හේතුවෙන් කුරුඳු සහ බුලත් අපනයන වර්ධනය විය.

**2008 වසර තුළදී කාර්මික නිෂ්පාදන එක්සත් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6,159 ලෙස සියයට 3.2 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරන ලද අතර, ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ඇඟළුම් සඳහා පැවැති ඉල්ලුම අඩුවීම ද ඒ සඳහා ආංශික වශයෙන් බලපාන ලදී.** දියුණු වෙමින් පවතින රටවල පැවැති දැඩි තරගකාරිත්වය, සාපේක්ෂ වශයෙන් ඉහළ නිෂ්පාදන පිරිවැය මෙන්ම එ.ජ.ඩොලරයට සාපේක්ෂව යූරෝ සහ බ්‍රිතාන්‍ය පවුම තියුණු ලෙස අවප්‍රමාණය වීමෙන් ශ්‍රී ලංකාවේ අපනයන තරගකාරිත්වය යම්තාක් දුරකට අඩු කිරීම, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පළමු කාර්තු තුන තුළ දී සියයට 4.8 කින් වර්ධනය වූ කාර්මික අපනයන එක්සත් ජනපදයෙහි ගෝලීය අර්බුදයත් සමඟ දුර්වල වූ ජාත්‍යන්තර ඉල්ලුම හේතුකොටගෙන අවසාන කාර්තුවේදී සියයට 1.3 දක්වා අඩු විය.

5.4 සංඛ්‍යා සටහන

## අපනයන සංයුතිය

| කාණ්ඩය | 2007(අ) වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2007(අ) දායකත්වය % | 2008(ආ) වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2008(ආ) දායකත්වය % | වටිනාකමේ වෙනස (ආ) එ.ජ. ඩොලර් දශලක්ෂ | වර්ධන වේගය (ආ) % | වර්ධනයට වූ දායකත්වය (ආ) % |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | **1,507.2** | **19.7** | **1,854.8** | **22.8** | **347.6** | **23.1** | **70.0** |
| තේ | 1,025.2 | 13.4 | 1,271.5 | 15.6 | 246.3 | 24.0 | 49.6 |
| රබර් | 109.4 | 1.4 | 125.1 | 1.5 | 15.7 | 14.4 | 3.2 |
| පොල් | 141.2 | 1.8 | 171.0 | 2.1 | 29.8 | 21.1 | 6.0 |
| මද නිෂ්පාදන | 60.3 | 0.8 | 82.4 | 1.0 | 22.0 | 36.6 | 4.4 |
| වෙනත් | 80.9 | 1.1 | 88.7 | 1.1 | 7.8 | 9.6 | 1.6 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 231.5 | 3.0 | 287.3 | 3.5 | 55.7 | 24.1 | 11.2 |
| **කාර්මික අපනයන** | **5,967.3** | **78.1** | **6,159.5** | **75.7** | **192.2** | **3.2** | **38.7** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 513.5 | 6.7 | 458.3 | 5.6 | -55.1 | -10.7 | -11.1 |
| රෙදිපිළි හා ඇඟළුම් | 3,339.6 | 43.7 | 3,468.7 | 42.6 | 129.1 | 3.9 | 26.0 |
| ඛනිජ නිෂ්පාදන | 168.9 | 2.2 | 254.8 | 3.1 | 85.9 | 50.9 | 17.3 |
| රබර් නිෂ්පාදන | 482.5 | 6.3 | 541.9 | 6.7 | 59.4 | 12.3 | 12.0 |
| පිඟන් නිෂ්පාදන | 47.1 | 0.6 | 49.0 | 0.6 | 2.0 | 4.2 | 0.4 |
| සම්, සංචාරක භාණ්ඩ හා සපත්තු | 22.9 | 0.3 | 16.7 | 0.2 | -6.3 | -27.3 | -1.3 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 542.2 | 7.1 | 461.0 | 5.7 | -81.2 | -15.0 | -16.4 |
| දියමන්ති හා ස්වර්ණාභරණ | 367.2 | 4.8 | 436.1 | 5.4 | 68.8 | 18.7 | 13.9 |
| වෙනත් | 483.6 | 6.3 | 473.1 | 5.8 | -10.5 | -2.2 | -2.1 |
| **ඛනිජ අපනයන** | **127.8** | **1.7** | **122.4** | **1.5** | **-5.4** | **-4.2** | **-1.1** |
| මැණික් | 105.5 | 1.4 | 101.0 | 1.2 | -4.4 | -4.2 | -0.9 |
| වෙනත් | 22.4 | 0.3 | 21.4 | 0.3 | -1.0 | -4.4 | -0.2 |
| **වර්ග නොකළ අපනයන** | 37.6 | 0.5 | 0.0 | 0.0 | -37.6 | -100.0 | -7.6 |
| **මුළු අපනයන (ඇ) (ඈ)** | **7,640.0** | **100.0** | **8,136.7** | **100.0** | **496.7** | **6.5** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය** | **110.6232** | | **108.3338** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ.
(ඈ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් ද්‍රව්‍ය අපනයනකරුවෝ
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇඟළුම් කර්මාන්තය මෑත කාලයේ ළඟාකරගත් සියයට 6-8 අතර වර්ධන අනුපාතය හා සන්සන්දනය කිරීමේදී, 2008 දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,469 ලෙස සියයට 3.9 ක සුළු ප්‍රමාණයකින් වර්ධනය විය. එසේ වුවද, ඇඟළුම් අපනයනවලින් සියයට 45 කට ආසන්නව දායක වෙමින් තනි රටක් ලෙස ගත්කළ ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ විශාලතම ඇඟළුම් අපනයන වෙළෙඳපොළ ලෙස තවදුරටත් පවතී. කෙසේ වෙතත්, ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ආනයනය කරන ඇඟළුම්වල, ශ්‍රී ලංකාවේ දායකත්වය 2008 දී අඩුවී ඇත.

ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන සඳහා විශාලතම වෙළෙඳපොළ වන යුරෝපා සංගමයට කරන ලද අපනයනවල තියුණු වැඩිවීම හේතුවෙන් මෑත වසරවලදී එක්සත් ජනපද වෙළෙඳපොළට කරනු ලබන අපනයනවල වර්ධන වේගය අඩුවීමේ බලපෑම යම්තාක් දුරකට සමනය විය. වෙළෙඳවරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ තීරු බදු රහිතව අපනයනය කිරීමට ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට ලබාදුන් සහන යුරෝපා සංගමය වෙත කරන ලද අපනයන වර්ධනය කරගැනීමට උපකාරී විය. යුරෝපා සංගමයේ සාමාජිකයන් අතර, එක්සත් රාජධානිය ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන සඳහා විශාලතම වෙළෙඳපොළ ලෙස පැවැති අතර ඉන් අනතුරුව ඉතාලිය සහ ජර්මනිය විය. වෙළෙඳ වරණයන් පිළිබඳව පොදු ක්‍රමයෙහි ඉදිරි තත්ත්වය පිළිබඳව වසරේ මැදභාගයේදී පැවැති අවිනිශ්චිතතාව හේතුවෙන් සමහර නිෂ්පාදකයින්ට බලපෑම් ඇති විය.

2008 වසර තුළදී ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන සහ සකස්කළ දියමන්ති වැනි අනෙකුත් කාර්මික අපනයන කාණ්ඩයන් බොහොමයක ඉපැයීම් වැඩි විය. දකුණු ආසියාතික කලාපයේ වරාය හා ආශ්‍රිත

සේවා සැපයීමේ ප්‍රමුඛයෙකු ලෙස තහවුරු වීමට දැනට ක්‍රියාත්මක කෙරෙන නැව්වලට තෙල් සැපයීම සහ අනෙකුත් සේවාවන් සැපයීමේ තරගකාරීත්වය සහ කාර්යක්ෂමතාවය ඉහල නැංවිය යුතුවේ. වසරේ ආරම්භයේ දී වර්ධනයක් සිදු වුවද විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ ජපානයේ ප්‍රධාන රථවාහන නිපදවන්නන් විසින් නිෂ්පාදනය අඩු කිරීම හේතුවෙන් ස්වාභාවික රබර්වලින් නිමැවුණු සන ටයර් සහ අනෙකුත් නිෂ්පාදන වසර අග භාගයේදී පසුබෑමකට ලක් විය. ආභරණ කර්මාන්තයෙහි වර්ණ ගන්වන ලද මැණික් සඳහා වූ ඉල්ලුම අඩු වුවද 2008 වසර තුළදී සකස් කල දියමන්ති සඳහා වූ ඉල්ලුම සියයට 20.2 ක වර්ධනයක් පෙන්වන ලදී. දියමන්ති ශ්‍රී ලංකාවේ හමුනොවූවද, සියයට 6 - 8 අතර ප්‍රමාණයකින් වටිනාකම එකතු කිරීමකින් යුක්තව, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 418.7 ක අපනයන සහිතව ශ්‍රී ලංකාව නැගී එන දියමන්ති සැකසුම් මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත වී ඇත. ගුණාත්මක බවින් උසස් දියමන්ති වෙළෙඳාම සඳහා ප්‍රචලිතව පවතින ඇන්ට්වප් (Antwerp) ප්‍රදේශයේ දියමන්ති කැපීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කීර්ති නාමයක් දිනාගෙන ඇත. 2008 වසරේ අයවැය මගින් මැණික් කර්මාන්තයේ එකතු කළ වටිනාකම ඉහළ නැංවීම සඳහා බදු නිදහස් කිරීම, අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා අපනයනකරුවන්ට අපනයන ආදායමෙන් සියයට 50 ක ප්‍රමාණයක් භාවිතා කිරීමට අවසර දීම සහ පවතින ආදායම් බදුවලට සාපේක්ෂව සියයට 2.5 ක පමණ අවම ආදයම් බද්දකට යටත් කිරීම යනාදී, සහනයන් ලබා දී ඇත.

## ආනයන ක්‍රියාකාරිත්වය

2007 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 11,296 ක් වූ ආනයන සමග සසඳන විට **2008 වසරේ ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 14,008 දක්වා සියයට 24.0 කින් වර්ධනය විය.** වෙළෙඳ භාණ්ඩවල අන්තර් ජාතික මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් 2008 වසරේ මුල් කාර්තු තුන ඇතුළත දී ආනයන සියයට 33.7 කින් වර්ධනය විය. ඉන් අනතුරුව, ගෝලීය ආර්ථික පරිසරය තුළ සිදුවූ වෙනස්කම් සමගින් ආනයන සැළකිය යුතු ලෙසින් අඩු විය. භාණ්ඩවල මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළයාම, 2008 සැප්තැම්බර් මාසය වන තුරුම ආනයන වියදම මත අයහපත් බලපෑමක් ඇතිකරන ලද අතර ප්‍රධාන ආනයන කාණ්ඩයන්හි ආනයනික වියදම ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය විය. මෙම කාලපරිච්ඡේදය තුළදී බනිජ තෙල් ඇතුළුව, අනෙකුත් බොහොමයක් භාණ්ඩයන්හි මිල ඓතිහාසික වශයෙන් ඉහළම අගයන් පෙළක් වාර්තා කරන ලදී. මෙම වර්ධනය සඳහා අන්තර් භාණ්ඩ ප්‍රධාන දායකත්වයක් සැපයූ අතර එය මූලික වශයෙන්ම බනිජ තෙල් ආනයන වියදම වැඩිවීම තුළින් සිදුවිය. 2007 දී මුළු ආනයන වියදමෙන් සියයට 22 කට බනිජ තෙල්, දායක වූ, අතර 2008 දී එම දායකත්වය සියයට 24 දක්වා වැඩි විය. කෙසේ වුවත්, ගෝලීය ආර්ථික අර්බුදය වසර අවසානයේ තීව්‍ර වීමත් සමඟ බනිජ තෙල් සහ අනෙකුත් භාණ්ඩ සඳහා ඉල්ලුම සැළකිය යුතු ආකාරයෙන් පසුබෑමකට ලක් වූ අතර මෙම ද්‍රව්‍යයන්ගේ මිල ගණන් ද ඒ අනුව පහත වැටුණි. මෙම අනපේක්ෂිත මිල පහත වැටීම අවසන් කාර්තුවේ ආනයන වියදම මත හිතකර බලපෑමක් ඇති කිරීමට සමත් විය. පළමු කාර්තු තුන තුළදී සියයට 61.4 කින් වර්ධනය වූ බනිජ තෙල් ආනයන, සිව්වන කාර්තුව තුළදී සියයට 25.6 කින් පහත වැටුණි. බනිජ තෙල් ඇතුළු අනෙකුත් ආනයන වියදම් අඩුවීමත් සමග අවසන් කාර්තුව තුළදී ආනයන වියදම ඉතා ශීඝ්‍රයෙන් පහත වැටුණු අතර එය පසුගිය වසරේ අනුරූප කාලයත් සමඟ සසඳන විට බොහෝ දුරට නොවෙනස් වූ අගයක පැවැතිණි.

**අන්තර්භාණ්ඩ සඳහා වන ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8,341 දක්වා සියයට 28 කින්**

5.4 රූප සටහන — භාණ්ඩ අනුව ආනයන



**5.5 සංඛ්‍යා සටහන**

**ආනයන සංයුතිය**

| කාණ්ඩය | 2007 (අ) | | 2008 (ආ) | | වටිනාකමේ වෙනස (ආ) එ.ජ. ඩොලර් දශලක්ෂ | වර්ධන වේගය (ආ) % | වර්ධනයට වූ දායකත්වය (ආ) % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **2,001.8** | **17.7** | **2,549.2** | **18.2** | **547.4** | **27.3** | **20.2** |
| ආහාර හා පාන වර්ග | 1,064.8 | 9.4 | 1,505.0 | 10.7 | 440.3 | 41.3 | 16.2 |
| සහල් | 38.7 | 0.3 | 43.8 | 0.3 | 5.1 | 13.0 | 0.2 |
| සීනි | 154.1 | 1.4 | 206.2 | 1.5 | 52.1 | 33.8 | 1.9 |
| කිරිඟු | 233.9 | 2.1 | 375.5 | 2.7 | 141.6 | 60.5 | 5.2 |
| වෙනත් | 638.1 | 5.6 | 879.5 | 6.3 | 241.6 | 37.9 | 8.9 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 937.1 | 8.3 | 1,044.2 | 7.5 | 107.1 | 11.4 | 4.0 |
| **අන්තර් භාණ්ඩ** | **6,517.3** | **57.7** | **8,340.6** | **59.5** | **1,823.3** | **28.0** | **67.2** |
| ඛනිජ තෙල් | 2,500.7 | 22.1 | 3,368.2 | 24.0 | 867.5 | 34.7 | 32.0 |
| පොහොර | 192.5 | 1.7 | 576.6 | 4.1 | 384.1 | 199.5 | 14.2 |
| රසායනික ද්‍රව්‍ය | 281.4 | 2.5 | 361.1 | 2.6 | 79.7 | 28.3 | 2.9 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,632.2 | 14.4 | 1,701.9 | 12.1 | 69.7 | 4.3 | 2.6 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 1,910.5 | 16.9 | 2,332.8 | 16.7 | 422.3 | 22.1 | 15.6 |
| **ආයෝජන භාණ්ඩ** | **2,685.2** | **23.8** | **2,978.8** | **21.3** | **293.7** | **10.9** | **10.8** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,246.7 | 11.0 | 1,307.7 | 9.3 | 60.9 | 4.9 | 2.2 |
| ගමනාගමන උපකරණ | 364.5 | 3.2 | 406.7 | 2.9 | 42.2 | 11.6 | 1.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 780.3 | 6.9 | 931.6 | 6.7 | 151.3 | 19.4 | 5.6 |
| වෙනත් | 293.6 | 2.6 | 332.9 | 2.4 | 39.3 | 13.4 | 1.4 |
| **වර්ග නොකළ ආනයන** | **92.2** | **0.8** | **139.4** | **1.0** | **47.2** | **51.1** | **1.7** |
| **මුළු ආනයන (ඇ)** | **11,296.5** | **100.0** | **14,008.0** | **100.0** | **2,711.5** | **24.0** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය** | **110.6232** | | **108.3338** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. පෞද්ගලික සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම

වර්ධනය වූ අතර එය 2008 වසරේ ආනයන වර්ධනයට සියයට 67 කින් පමණ දායක විය. ඛනිජ තෙල් හැරුණු විට, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඉහළ ගිය පොහොර මිල ගණන් සහ පොහොර සහනාධාරයත් සමග ඉහළ ගිය පොහොර ආනයන පරිමාව හේතුවෙන් පොහොර ආනයන වියදමෙහිද සැළකිය යුතු වර්ධනයක් 2008 වසරේ දී වාර්තා කරන ලදී. 2008 වර්ෂය තුළ ආනයන කළ මුළු පොහොර ප්‍රමාණයෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලාංකික ගොවීන් විසින් බහුල වශයෙන් භාවිතා කරනු ලබන යූරියා පොහොරවලින් සමන්විත වේ. කෘෂිකාර්මික නිෂ්පාදන මිල ගණන්වල පැවැති යහපත් ප්‍රවණතාවය සමග, සමහර ගොවීන් මෙතෙක් වගා නොකළ ඉඩම්වල පවා සිය වගාවන් ව්‍යාප්ත කිරීමට නැඹුරු වීම හේතුවෙන් පොහොර අවශ්‍යතාවය ඉහළ යන ලදී. ඇඟළුම් අපනයනයේ මන්දගාමී වර්ධනයක් පිළිබිඹු කරමින් 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,702 ක් වූ රෙදිපිළි ආනයනය, 2007 වසරට සාපේක්ෂව සියයට 4.3 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.

**පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,549 දක්වා සියයට 27.3 කින් ඉහළ ගියේය.** ඉතා ඉහළ මට්ටමක පැවැති කිරිඟු, කිරි, සීනි සහ සහල්වල මිල ගණන් පිළිබිඹු කරමින් පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ ආහාර හා පාන වර්ග සඳහා වන වියදම සැළකිය යුතු අන්දමින් ඉහළ ගියේය. 2008 වසරේදී ආනයනය කරන ලද කිරිඟු ප්‍රමාණය සියයට 3.5 කින් ආන්තික වශයෙන් අඩු විය. 2008 වසරේදී මෝටර් රථ ආනයන වියදම සියයට 16.2 ක ඉහළ වර්ධනයක් වාර්තා කළ අතර, 2007 වසරේ දී ආරම්භ කර 2008 වසරේ අප්‍රේල් මාසයේ දී අහෝසි කරන ලද, රාජ්‍ය සේවකයින්ට ලබා දුන් තීරු බදු රහිත වාහන ආනයනය කිරීමේ සහනය මෙම වර්ධනයට දායක විය.

**2008 වසරේදී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වර්ධනය මූලික කොට, ආයෝජන භාණ්ඩ ආනයනය ද එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,979 දක්වා සියයට 10.9 කින් තවදුරටත් ඉහළ යන ලදී.** රට තුළ විවිධ, විශාල පරිමාණයේ යටිතල පහසුකම් සංවර්ධනය

**5.6 සංඛ්‍යා සටහන** **ප්‍රධාන ආනයනයන්හි පරිමාවන් (අ)**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2004 | 2005 | 2006 | 2007 (ආ) | 2008 (ඇ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **222** | **52** | **12** | **88** | **84** |
| 1 වන කාර්තුව | 9 | 43 | 3 | 4 | 41 |
| 2 වන කාර්තුව | 9 | 4 | 2 | 7 | 28 |
| 3 වන කාර්තුව | 4 | 2 | 3 | 3 | 12 |
| 4 වන කාර්තුව | 200 | 3 | 4 | 74 | 03 |
| **තිරිඟු** | **993** | **864** | **1,200** | **952** | **919** |
| 1 වන කාර්තුව | 257 | 272 | 287 | 204 | 272 |
| 2 වන කාර්තුව | 218 | 191 | 321 | 388 | 312 |
| 3 වන කාර්තුව | 189 | 174 | 331 | 274 | 153 |
| 4 වන කාර්තුව | 329 | 227 | 261 | 87 | 182 |
| **සීනි** | **438** | **418** | **525** | **481** | **575** |
| 1 වන කාර්තුව | 98 | 49 | 112 | 112 | 163 |
| 2 වන කාර්තුව | 173 | 167 | 137 | 138 | 131 |
| 3 වන කාර්තුව | 71 | 94 | 127 | 118 | 167 |
| 4 වන කාර්තුව | 96 | 108 | 149 | 113 | 114 |
| **ඛනිජ තෙල් (බොර තෙල්)** | **2,200** | **2,008** | **2,151** | **1,938** | **1,853** |
| 1 වන කාර්තුව | 586 | 586 | 592 | 272 | 229 |
| 2 වන කාර්තුව | 464 | 581 | 535 | 557 | 525 |
| 3 වන කාර්තුව | 634 | 246 | 582 | 559 | 544 |
| 4 වන කාර්තුව | 516 | 595 | 442 | 550 | 555 |
| **පිරිපහදු ඛනිජ තෙල්** | **1,645** | **1,823** | **2,302** | **2,314** | **2,386** |
| 1 වන කාර්තුව | 460 | 314 | 540 | 597 | 778 |
| 2 වන කාර්තුව | 380 | 396 | 587 | 646 | 583 |
| 3 වන කාර්තුව | 341 | 711 | 479 | 517 | 465 |
| 4 වන කාර්තුව | 464 | 402 | 696 | 554 | 560 |
| **පොහොර** | **510** | **529** | **633** | **569** | **773** |
| 1 වන කාර්තුව | 54 | 168 | 166 | 62 | 125 |
| 2 වන කාර්තුව | 164 | 111 | 203 | 171 | 223 |
| 3 වන කාර්තුව | 76 | 142 | 119 | 131 | 216 |
| 4 වන කාර්තුව | 216 | 107 | 146 | 205 | 209 |

(අ) ගලපන ලද
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි. ඕ. සී. පුද්ගලික සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරෙන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම

කිරීමේ ව්‍යාපෘති ද මේ සඳහා හේතුවී ඇත. විදේශාධාර උපයෝජන අනුපාතයෙහි හිතකර ප්‍රවණතාවයත්, විදේශාධාර ක්‍රමවත් ලෙස උපයෝජනය කිරීමත්, විදේශ ආයතනවලින් ලබාදීමට නියමිත ණය ආධාර ඉහළයාමත් මේ සඳහා ඉවහල් විය. කෙසේ වෙතත්, වසර අවසාන වන විට ගෝලීය මූල්‍ය අර්බුදය තීව්‍ර වීමත් සමඟ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශය අපේක්ෂා කළ විදේශීය මූල්‍ය ප්‍රතිපාදන යම් ප්‍රමාණයකට අඩපණ වීමත් සමඟ යටිතල පහසුකම් සැපයීමේ සමහරක් ව්‍යාපෘතිවලට යම් බලපෑමක් ඇති විය. චීනය, ඉන්දියාව වැනි නැඟී එන වෙළෙඳපොළවල ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරිත්වයේ මන්දගාමිත්වය සහ සංවර්ධිත රටවල ආර්ථිකයේ වූ පසුබෑමත් සමඟ වසරේ අවසන් කාල පරිච්ඡේදය තුළදී පහළ මට්ටමක පවතින ප්‍රාග්ධන භාණ්ඩවල අන්තර්ජාතික මිල 2009 වසරේ වැඩි කාලයක් තුළ ද පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## වෙළෙඳ ශේෂය

අපනයන වර්ධනයට සාපේක්ෂව ආනයන වියදමෙහි වූ ඉහළ වර්ධනය, 2008 වසරේදී වෙළෙඳ හිඟය සැළකිය යුතු ලෙසින් පුළුල් වීමට දායක විය. 2007 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,656 ක් වූ සමස්ථ වෙළෙඳ හිඟය 2008 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,871 දක්වා සියයට 60.6 කින් පුළුල් විය.

## වෙළෙඳ අනුපාතය

කෘෂිකාර්මික අපනයනයනවලට යහපත් මිල ගණන් ලැබුණද ඛනිජ තෙල් මූලික කරගත් පාරිභෝජන භාණ්ඩයන්හි අන්තර්ජාතික මිල ගණන් ඉහළ යාම හේතුවෙන් 2008 වසරේදී වෙළෙඳ අනුපාතය සියයට 10.6 කින් පිරිහීමකට ලක්විය.

2008 වසරේදී අපනයන මිල සියයට 6.1 කින් වර්ධනය විය. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේවල මාසික සාමාන්‍ය මිල කැපීපෙනෙන ලෙස ඉහළ ගිය අතර තේ කිලෝග්‍රෑමයක් සඳහා මෙතෙක් පැවැති ඉහළම මිල වන එ.ජ.ඩොලර් 4.28 ක් 2008 සැප්තැම්බර් මාසයේදී වාර්තා කරන ලදී. කෙසේ වුවද, සැප්තැම්බර් මාසය අවසානයේ සිට මිල උත්පාතය අවසන් වී අවපාත තත්ත්වයක් පැන නැගුණි. ඛනිජ තෙල් මිල අනපේක්ෂිත ලෙස පහළයාමෙන් තෙල් අපනයනය කරන ප්‍රධාන රටවලට සිදුවූ බලපෑමෙන් ඇති වූ ආදායම් ප්‍රතිවිපාකය ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රධාන ගැණුම්කරුවන්ගේ ඉල්ලුම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන ලදී. ලෝකයේ අනිකුත් තේ අපනයන කරන රටවල් ගෝලීය අවපාතයේ බලපෑමට ලක්වීමත් සමඟ මෙම තත්ත්වය වඩාත් තීව්‍ර විය. 2007 වසරේදී අපනයනය කරන ලද තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල එ.ජ.ඩොලර් 3.29 ක් වූ අතර, 2008 වසරේ තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල එ.ජ.ඩොලර් 3.98 ක් විය. තේ මෙන්ම අපනයනය කරන ලද ස්වභාවික රබර් ද 2008 පළමු මාස අට තුළදී ඉතා ආකර්ශණීය මිලක් අත්කර ගත්තා ලදී. රබර් කිලෝග්‍රෑමයක ඉහළම අපනයන මිල 2008 ජූලි මාසයේ දී එ.ජ.ඩොලර් 3.24 ලෙස වාර්තා වූ අතර ඉන් අනතුරුව අපනයන මිල පහත වැටීමේ නැඹුරුවක් දක්නට ලැබුණි. 2007 වසරේදී රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ.ඩොලර් 2.12 ක් වූ අතර 2008 වසරේදී රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ.ඩොලර් 2.57 ක් විය. බොරතෙල් මිල ඉහළ යාම නිසා කෘත්‍රිම රබර් නිෂ්පාදන වියදම

**5.5 රූප සටහන** — **වෙළෙඳ අනුපාතය සහ වෙළෙඳ දර්ශක**




ඉහළයාම සහ ටයර් නිෂ්පාදකයින්ගෙන් විශේෂයෙන් ලෝකයේ විශාලතම රබර් පරිභෝජකයා සහ ටයර් අපනයනකරු ලෙස චීනයෙන් ඇතිවූ ඉහළ ඉල්ලුම මෙම සැළකිය යුතු ලෙස මිල ඉහළයාම තුළින් පිළිබිඹු කරන ලදී. කෙසේ වුවද, පසුව පහත වැටුණු තෙල් මිල කෘත්‍රිම රබර් සඳහා පැවැති අඩු මිල ගණන් මඟින් ද පෙන්නුම් කෙරුණි. එසේම 2008 වසර තුළදී පොල් සහ කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි හා දුම්කොළ වැනි අනෙකුත් සුළු කෘෂිකාර්මික භෝග නිෂ්පාදනයන්හි අපනයන මිල ගණන් ඉහළ යන ලදී.

2008 වසරේදී ආනයන මිල සියයට 18.7 කින් වර්ධනය විය. එක්සත් ජනපදයෙහි ඉහළ පරිභෝජනය සහ මෑත කාලීන ගෝලීය, වර්ධනය සඳහා මූලිකත්වය සැපයූ චීනය, ඉන්දියාව සහ අනෙකුත් නැගී එන ආර්ථිකයන්හි දැඩි ඉල්ලුමට සරිලන සැපයුමක් සිදු නොවීමෙන් වෙළෙඳ භාණ්ඩ මිල 2008 වන විට දශක කිහිපයක් තුළදී මෙතෙක් පැවැති ඉහළම මිල ගණන් කරා ළඟා විය. බොර තෙල් මිල ගණන්වල ශීඝ්‍ර ඉහළයාමේ බලපෑම, 2008 වසරේ මැද භාගය වන තුරු අඛණ්ඩව තියුණු ලෙස ඉහළ ගිය ආහාර සහ ලෝහ ඇතුළු අනෙකුත් ප්‍රාථමික භාණ්ඩවලට ද පැතිරිණි. ආනයනික බොරතෙල් මිල ලෝක වෙළෙඳපොළ මිල ගණන්වලට සමගාමීව, 2008 ජූලි මාසය වන තුරු කැපී පෙනෙන වර්ධනයක් පෙන්වූ අතර, බොරතෙල් බැරලයක මෙතෙක් පැවැති ඉහළම සාමාන්‍ය ආනයනික මිල වන එ.ජ.ඩොලර් 134.34 ක අගය 2008 ජූලි මාසයේ දී වාර්තා විය. පසුව, 2008 දෙසැම්බර් මාසය වන විට ආනයනික බොරතෙල් බැරලයක මිල එ.ජ.ඩොලර් 46.24 දක්වා සීඝ්‍රයෙන් පහත වැටුණි. ආනයනික තිරිඟු මෙට්‍රික් ටොන් එකක් සඳහා 1970 මැද භාගයේ සිට මෙතෙක් පැවැති ඉහළම අගය වන ලෙස මෙට්‍රික් ටොන් එකක සාමාන්‍ය මිල එ.ජ.ඩොලර් 454.59 ලෙස 2008 ඔක්තෝබර් මාසයේ දී වාර්තා විය. පසුගිය වසර සමග සසඳා බලන විට 2008 වසරේදී අන්තර්ජාතික වෙළෙඳපොළෙහි සීනි මිල ගණන්ද ඉහළ යන ලදී. රටවල් කිහිපයක්ම සීනි නිෂ්පාදනය වෙනුවට ධාන්‍ය නිෂ්පාදනයට යොමුවීම නිසා 2008 වර්ෂයේදී සීනි නිෂ්පාදනය ද පහත වැටුණි. වෙළෙඳ භාණ්ඩ මිලෙහි ඉහළයාම 2008 අවසානයේ දී ගෝලීය මූල්‍ය අර්බුදය සහ ආර්ථික පසුගාමීත්වය සමග බිඳ වැටුණු අතර එය මෙම සියවසෙහි ප්‍රබලතම මිල උච්ඡාවචනය ලෙස බොහෝ දෙනා පවසයි.

## වෙළෙඳ දිශාව

2008 වසරේදී ද බටහිර රටවල් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ප්‍රධාන ඉල්ලුම්කරුවන් වූ අතර

**5.6 රූප සටහන** — **අපනයන වෙළෙඳ දිශාව**



**5.7 රූප සටහන** **ආනයන වෙළෙඳ දිශාව**




ආසියානු රටවල් ශ්‍රී ලංකාවේ ආනයන සඳහා ප්‍රධාන මූලය විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය තවදුරටත් විශාලතම අපනයන දිශාවන් වූ අතර, පිළිවෙලින් ඉන්දියාව, සිංගප්පූරුව ඉරානය සහ චීනය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන මූලයන් විය.

ශ්‍රී ලංකාවේ මුළු අපනයනවලින් සියයට 23 කට දායක වෙමින් ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රධානතම අපනයන ගමනාන්තය විය. ඇමෙරිකා එක්සත් ජනපදයට කරනු ලබන ඇඟළුම් අපනයන පහළ යාමත් සමඟ 2008 දී එක්සත් ජනපදයට කළ සමස්ත අපනයන සියයට 5.1 කින් පහළ යන ලදී. 2008 වසරේ ඇමෙරිකා එක්සත් ජනපදයට කළ ඇඟළුම් අපනයන සියයට 5.4 කින් අඩුවූ අතර, යුරෝපා සංගමයට කළ ඇඟළුම් අපනයන සියයට 12.5 කින් වර්ධනය විය. 2008 වසරේ යුරෝපා සංගමය තුළ සියයට 7.1 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් එක්සත් රාජධානිය ශ්‍රී ලංකාවෙහි දෙවන විශාලතම අපනයන ගමනාන්තය වූ අතර, ඉතාලිය සහ බෙල්ජියම - ලක්සම්බර්ග්වලට කරන ලද අපනයන පිළිවෙලින් සියයට 12.7 කින් සහ සියයට 6.3 කින් විය. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ ලැබී ඇති තීරු බදු සහන හේතුවෙන් යුරෝපා කලාපය තුළ බොහෝ රටවල අපනයන වර්ධනය විය. 2007 වසරේ ඉන්දියාව තෙවන විශාලතම අපනයන ගමනාන්තය වුවද, 2008 වසරේ දී ඉන්දියාවට කරනු ලැබූ අපනයන සියයට 18.8 කින් අඩු වෙමින් එය අපනයන විශාලත්වය අනුව පස්වන ස්ථානයට පත් විය. ඉන්දියාවට කළ අපනයන ප්‍රධාන වශයෙන් එළවළු තෙල්, කුළුබඩු, රබර් නිෂ්පාදන සහ මැණික්වලින් සමන්විත විය.

කෙසේ වෙතත්, ආනයන සැලකිල්ලට ගත් විට ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයන ප්‍රභවය විය. 2007 වසරේ දී ශ්‍රී ලංකාවේ ආනයන සඳහා ඉන්දියාව සියයට 23 කින් දායක වූ අතර, 2008 වසරේ එහි දායකත්වය සියයට 25 ක් පමණ වෙමින් ඉන්දියාවෙන් කළ ආනයන සියයට 32 කින් වර්ධනය විය. ඉහළ ආනයන තුළින් රටෙහි ප්‍රධානතම වෙළෙඳ හවුල්කරු ලෙස ඉන්දියාව අත්කරගෙන තිබෙන අද්විතීය ස්ථානය ඉස්මතු කරමින් ඉන්දියාව සමඟ කරන ලද මුළු වෙළෙඳාම 2008 වසරේදී එ.ජ.ඩොලර් බිලියන 3.9 ඉක්මවන ලදී. පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන, සීනි, මෝටර් රථවාහන සහ බයිසිකල්, ත්‍රීරෝද රථ සහ තඹ රැහැන් ආදිය ඉන්දියාවෙන් කළ ආනයන අතර ප්‍රධාන වේ. සිංගප්පූරුව සහ ඉරානය පිළිවෙලින් දෙවන හා තෙවන විශාලතම ආනයන මූලාශ්‍ර රටවල් ලෙස 2008 දී ආනයන වර්ධන වේගය පිළිවෙලින් සියයට 11.1 හා සියයට 41.5 ලෙස වාර්තා කළේය. එම මුළු ආනයනවලට පිළිවෙලින් සියයට 8.9 ක් හා සියයට 8.5 ක් විය. පොහොර, ඛනිජ තෙල් නිෂ්පාදන සහ සකස් නොකළ රත්‍රන් සිංගප්පූරුවෙන් කළ ප්‍රධාන ආනයන වූ අතර බොරතෙල් ඉරානයෙන් කළ ප්‍රධානතම ආනයනය විය. එසේම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවයන් බවට පත්වී සිටින චීනය සහ හොංකොං යන රටවල්වල ආනයන දායකත්වය 2008 දී පිළිවෙලින් සියයට 7.8 ක් සහ සියයට 5 ක් විය.

## 5.4 සේවා වෙළෙඳාම, ආදායම, සංක්‍රාම සහ ජංගම ගිණුමේ ශේෂය

### සේවා වෙළෙඳාම

2007 වසරේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 302 ක් වූ සේවා වෙළෙඳාමේ අතිරික්තය 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 402 ක් දක්වා සැළකිය යුතු ආකාරයෙන් පුළුල් විය. 2008 වසරේ දී ප්‍රවාහන සේවා, විදුලි සංදේශ, පරිගණක හා තොරතුරු තාක්ෂණ සේවා,

ඉදිකිරීම් හා රක්ෂණ සේවා ක්ෂේත්‍රයන්හි අතිරික්තයක් වාර්තා විය. විදේශ ගමන් සහ අනිකුත් ව්‍යාපාර සේවාවන්හි පැවැති හිඟය හේතුවෙන් ඉහත ක්ෂේත්‍රයන්හි පැවැති පුළුල් වර්ධනය යම් පමණකට මැඩ පැවැත්විණි.

## ප්‍රවාහන සේවා

**සේවා අංශයේ වර්ධනයට, එම අංශයේ විශාලතම සංරචකය වන ප්‍රවාහන සේවා අංශය මූලික වශයෙන් දායක විය.** ගෝලීය ආර්ථික කටයුතුවල පසුබෑම මධ්‍යයේ වුවද, මගී ගාස්තු, නැව් කුලී, සහ අනිකුත් වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් සමන්විත ප්‍රවාහන සේවා ඉපැයීම් මුල් මාස නවය තුළ සියයට 22 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, ජාත්‍යන්තර වෙළෙඳාමේ ශීඝ්‍ර පහළයාම සහ ගෝලීය ආර්ථික පසුබෑමේ බලපෑම පුළුල් වීමත් සමඟම මගී ගමනාගමනය, නැව්ගත භාණ්ඩ ප්‍රවාහනය, නැව් කුලී සහ මගී ගාස්තුන්හි අඩු වීමක් දක්නට ලැබුණු අතර, එමගින් අවසාන කාර්තුව තුළ දී ප්‍රවාහන සේවා අංශයේ එම වර්ධනය ක්‍රමයෙන් පිරිහීමට ලක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2008 වසර තුළ දී ප්‍රවාහන සේවා ඉපැයීම් හි වාර්ෂික වර්ධනය සියයට 19.3 කට සීමා වූ අතර, එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 999 ක් ලෙස වාර්තා විය. මේ අතර, වසරේ වැඩි කාලයක් තුළ ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවැතුණු ඉහළ මගී ගාස්තු සහ නැව් කුලී හේතුවෙන් ප්‍රවාහන සේවා ගෙවීම් ද, සියයට 17.3 කින් වර්ධනය විය.

**ඉන්ධන අධිභාරය පැනවීම හේතුවෙන් ඉහළ ගිය ගුවන් ගමන් ගාස්තු, මගී ගාස්තු මත ඉපැයීම් වැඩිකරලීමට ප්‍රධාන වශයෙන් හේතු විය.** කෙසේ වෙතත්, වසරේ අග භාගය වන විට, ගෝලීය ආර්ථික පසුබෑම හේතුවෙන් ව්‍යාපාර කටයුතු, රැස්වීම් සහ සම්මේලන සඳහා වන විදේශ සංචාරයන්හි දක්නට ලැබුණු අඩු වීම නිසා මගී ගාස්තු මත ඉපැයීම්හි අඩුවීමක් දක්නට ලැබුණි. පසුබෑමට ලක් වූ ගුවන් සේවා අංශය යළි නගා සිටුවීමේ පියවරක් වශයෙන් මෙම සේවා අංශය විසින් භාණ්ඩ ප්‍රවාහනය, ගුවන් මගීන් සඳහා ආහාර පාන සැපයීම, ගුවන් තොටුපොළ අනිකුත් සේවාවන්, සහ ඉංජිනේරු සේවා සහ ගුවන්යානා ඉංජිනේරු පුහුණුව වැනි නව අංශ කරා යොමු වීමට ඇති හැකියාවන් පිළිබඳව සලකා බලමින් සිටී. තවද, ශීඝ්‍රයෙන් වර්ධනය වන ඉන්දියානු වෙළෙඳපොළ හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන් සේවය (SriLankan Airlines) මගින් ක්‍රියාත්මක කරන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ඉදිකරන ලද නවතම භාණ්ඩ හැසිරවීමේ පර්යන්තය මගින් හසුරුවනු ලබන භාණ්ඩ ධාරිතාව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**5.7 සංඛ්‍යා සටහන**

**ශුද්ධ සේවා, ආදායම් සහ සංක්‍රාම (අ)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | රුපියල් දශ ලක්ෂ | |
|---|---|---|---|---|
| | 2007 | 2008 (ආ) | 2007 | 2008 (ආ) |
| 1. ප්‍රවාහනය | 241 | 299 | 26,728 | 32,458 |
| 2. සංචාරක | -8 | -86 | -851 | -9,297 |
| 3. විදුලි සංදේශ සේවා | 18 | 26 | 1,984 | 2,756 |
| 4. පරිගණක සහ තොරතුරු සේවා | 175 | 230 | 19,359 | 24,917 |
| 5. ඉදිකිරීම් සේවා | 27 | 35 | 3,015 | 3,774 |
| 6. රක්ෂණ සේවා | 15 | 22 | 1,681 | 2,337 |
| 7. වෙනත් ව්‍යාපාරික සේවා | -153 | -109 | -17,029 | -11,757 |
| 8. රජයේ වියදම් (අන් තැනක සඳහන් නොවන) | -14 | -14 | -1,531 | -1,508 |
| **මුළු සේවා** | **302** | **402** | **33,357** | **43,680** |
| 1. සේවක වන්දි ගෙවීම් | -11 | -14 | -1,240 | -1,483 |
| 2. සෘජු ආයෝජන ආදායම් | -346 | -464 | -38,287 | -50,256 |
| 3. පොලී සහ අනෙකුත් ගෙවීම් | -1 | -495 | 472 | -53,293 |
| **මුළු ආදායම** | **-358** | **-972** | **-39,054** | **-105,032** |
| 1. පෞද්ගලික | 2,214 | 2,565 | 245,006 | 277,711 |
| 2. මධ්‍යම ආණ්ඩුව | 97 | 101 | 10,677 | 10,928 |
| **මුළු ජංගම සංක්‍රාම** | **2,311** | **2,666** | **255,684** | **288,639** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම ඉදිරිපත්කිරීම ගෙවුම් තුලන අත්පොතෙහි 5 වන සංශෝධනය (1993)ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන ආකාරයට සැසඳෙන ලෙස ඉදිරිපත් කර ඇත.
(ආ) තාවකාලික

**කොළඹ වරායේ සේවා සැපයීමේ දී ඇතිවූ ඉහළ වර්ධනය සහ පුළුල් වන ඉන්දියානු ආර්ථිකය හේතුවෙන් ඉහළ ගිය බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම්, වරාය ආශ්‍රිත කටයුතුවලින් ලද දළ ඉපැයීම් ඉහළ යාම සඳහා බලපෑවේය.** 2008 වසර තුළ දී, කොළඹ වරායේ ප්‍රතිනැව්ගත කිරීම් සියයට 11.5 ක වර්ධනයක් පෙන්නුම් කළේය. වරාය ආශ්‍රිත කටයුතුවල වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමටත්, කලාපයේ අනෙකුත් තරගකාරී වරායන්ගෙන් එල්ල විය හැකි ඉදිරි අභියෝගවලට සාර්ථකව මුහුණ දීමටත් සුදුසු වන පරිදි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තම මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමටත් එහි ඵලදායීත්වය වැඩි කර ගැනීමටත් පියවර ගෙන ඇත.

## විදේශ ගමන් සහ සංචාරක සේවා

**2008 වසර තුළ දී ද සංචාරක කර්මාන්තය තවදුරටත් මන්දගාමී ස්වභාවයක් ඉසිලීය.** 2007 වසරේ දී 494,008 ක් වූ සංචාරක පැමිණීම් 2008 වසරේ දී 438,475 දක්වා සියයට 11.2 කින් පහළ ගියේය. වසරේ මුල් භාගය තුළ දී, සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල් කිහිපයක් විසින් නිකුත් කරන ලද අහිතකර සංචාරක උපදේශයන්

**5.8 සංඛ්‍යා සටහන** — **සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2004 | 2005 | 2006 | 2007(අ) | 2008(ආ) | වර්ධන වේගය (%) 2007(අ) | වර්ධන වේගය (%) 2008(ආ) |
|---|---|---|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 566,202 | 549,308 | 559,603 | 494,008 | 438,475 | -11.7 | -11.2 |
| 2. සංචාරක රාත්‍රී ගණන (දහස්) | 5,742 | 4,754 | 5,793 | 4,940 | 4,165 | -14.7 | -15.7 |
| 3. කාමර උපයෝජන අනුපාතය (%) | 59.3 | 45.4 | 47.8 | 46.2 | 43.9 | -3.3 | -5.0 |
| 4. දළ සංචාරක ලැබීම් (රු. දශ ලක්ෂ) | 42,059 | 36,377 | 42,586 | 42,571 | 37,094 | 0.0 | -12.7 |
| 5. ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 74,283 | 66,223 | 76,100 | 86,175 | 84,598 | 13.2 | -1.8 |
| 6. මුළු සේවා නියුක්තිය | 129,038 | 125,004 | 133,558 | 145,239 | 124,456 | 8.7 | -14.3 |
| සෘජු | 53,766 | 52,085 | 55,649 | 60,516 | 51,857 | 8.7 | -14.3 |
| වක්‍ර | 75,272 | 72,919 | 77,909 | 84,723 | 72,599 | 8.7 | -14.3 |

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

සංචාරක කර්මාන්තයේ වර්ධනයට අහිතකර ලෙස බලපෑ අතර, වසරේ අග භාගය වන විට ගෝලීය මූල්‍ය අර්බුදය තුළින් හට ගත් ගෝලීය ආර්ථික අවපාතය මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කිරීමට හේතු විය. 2008 වසර තුළ දී, ප්‍රධාන සංචාරක වෙළෙඳපොළවල් වන දකුණු ආසියාව සහ බටහිර යුරෝපය මෙන්ම නැගෙනහිර ආසියාව, උතුරු ඇමෙරිකාව සහ ඕස්ට්‍රේලියාව වැනි අනිකුත් වෙළෙඳපොළවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව අඩු විය. මැද පෙරදිග සහ නැගෙනහිර යුරෝපයෙන් වූ සංචාරක පැමිණීම් ඉහළ ගියේය. 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 385 ක් වූ සංචාරක ඉපැයීම් 2008 වසරේ දී, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 342 දක්වා අඩු විය. සංචාරකයින් පැමිණි අරමුණු අනුව සැලකූ විට, 2008 වසරේ දී මුළු පැමිණීම් ගණන වන 438,475 න් බහුතරයක්, එනම්, සියයට 73.2 ක් නිවාඩු ගත කිරීම සඳහා ද, සියයට 8.5 ක් ව්‍යාපාර කටයුතු සඳහා ද, සියයට 8.3 ක් මිතුරන් හා ඥාතීන් හමුවීමට ද, සියයට 2.6 ක් ආගමික සහ සංස්කෘතික කටයුතු සඳහා ද, සියයට 1.3 ක් සම්මේලන සහ රැස්වීම් සඳහා ද පැමිණ ඇත.

විවිධ වූ බාධක සහ අභියෝග මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. වර්ධන විභවතාවක් පෙන්නුම් කළ ඉන්දියාව, එක්සත් රාජධානිය, රුසියාව සහ මැද පෙරදිග වැනි රටවල් ඉලක්ක කරමින් 'කළමනාකරණ උපක්‍රම සහ කාර්ය සැලසුම: 2008 - 2010' ඉදිරිපත් කරන ලදී. නැගෙනහිර පළාතේ සංචාරක කර්මාන්තය යළි නගා සිටුවීමට පියවර ගණනාවක් ගෙන ඇත. එසේම දැඩි පසුබෑමට ලක් වූ සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්කරවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් 2009 වසරේ පුනර්ජීවන වැඩපිළිවෙලක් හඳුන්වා දුන් අතර, සංචාරක කර්මාන්තයේ නියුතු වූවන් හට ලබා දුන් ණය ප්‍රතිලැයිස්තුගත කිරීම්, ඉන්ධන අධිභාරය සහ ආර්ථික සේවා ගාස්තුව (ESC) අය නොකිරීම මෙයට ඇතුළත් වේ. ගෝලීය ආර්ථික පසුබෑමෙහි ප්‍රතිඵල පිළිබිඹු කරමින්, 2008 මැද භාගයේ සිට ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරයේ දක්නට ලැබුණු ශීඝ්‍ර පසුබෑම, 2009 වසර තුළදී ද පවතිනු ඇත. කෙසේ නමුදු, දශක දෙකකටත් වඩා පැවතුණු ත්‍රස්තවාදයට එරෙහි වූ යුද්ධය ඉතා ඉක්මණින් නිමා වීමත් සමඟ, මැදිකාලීනව, ආර්ථිකයේ ප්‍රධානතම අංශයක් ලෙස සංචාරක කර්මාන්තය ඉස්මතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සේවා

2008 වසරේ දී විදුලි සංදේශ සේවාවලින් ලද ශුද්ධ ඉපැයීම් සියයට 42 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, විදුලි සංදේශ සේවා සඳහා වන ගෙවීම් අඩු වේගයකින් වුවද වර්ධනය වීම සඳහා විද්‍යුත් තැපැල භාවිතය, වැඩි ධාරිතාවයකින් යුත් අන්තර්ජාල පහසුකම් භාවිතය, චන්ද්‍රිකා තාක්ෂණය උපයෝගී කොට ගෙන විකාශනය වන රූපවාහිනී නාලිකා භාවිතය සහ ජාත්‍යන්තර සෘජු දුරකථන භාවිතය ඉහළ යාම හේතුවිය. නව විදුලි සංදේශ සමාගම් වෙළෙඳපොළට පිවිසීමත් සමඟ ඇතිවූ ඉහළ තරගකාරිත්වය හේතුවෙන් ජංගම සහ ස්ථාවර දුරකථන පහසුකම් සපයන සමාගම් විසින් ජාත්‍යන්තර සෘජු ඇමතුම් ගාස්තු පහළ දැමීම, ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් භාවිතය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය.

පරිගණක මෘදුකාංග, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO), දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) ඇතුළු තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් අනෙකුත් සේවා සැපයීම සඳහා වූ ඉතා ආකර්ෂණීය අක්වෙරළ මූලස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත්වෙමින් පවතී.

2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 175 ක් ලෙස වාර්තා වූ තොරතුරු තාක්ෂණ සේවා හා අදාළ දළ ලැබීම් 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 230 ක් දක්වා සියයට 31 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් අනෙකුත් සේවා අපනයනයන්හි ප්‍රධාන වෙළෙඳපොළ ලෙස යුරෝපය සහ උතුරු ඇමෙරිකාව සැලකිය හැකි වුවද, අප්‍රිකාව සහ මැද පෙරදිග කලාපයේ රටවල ද වෙළෙඳපොළ කොටස තවදුරටත් ව්‍යාප්ත කරගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා ඇත. තරගකාරී මෙහෙයුම් වියදම්, වැඩිදියුණු කළ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ යටිතල පහසුකම්, පුහුණු ශ්‍රමය ලබාගැනීමේ හැකියාව, සේවා බදු සහන තුළින් ඇති වූ මිල තරගකාරිත්වය මෙන්ම ගුණාත්මක හා විශ්වාසනීය සේවා සැපයීම හේතුවෙන් ගෝලීය මූල්‍ය අර්බුදය මධ්‍යයේ වුවද, තොරතුරු තාක්ෂණ සේවා වෙළෙඳාම අඛණ්ඩව වර්ධනය විය.

**2008 වසර තුළ දී, තොරතුරු තාක්ෂණ සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් අනෙකුත් සේවාවන්හි වර්ධනය පාදක වන හිතකර පරිසරයක් ගොඩනැගීම උදෙසා ක්‍රියාමාර්ග කිහිපයකට මුල පුරන ලදී.** මෙම ක්‍රියාමාර්ග අතරින් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ යටිතල පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම, තොරතුරු තාක්ෂණ කලාප බිහිකිරීම, තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව සඳහා ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ජනාධිපති කාර්යය සාධන බලකායක් පත් කිරීම යනාදිය තොරතුරු තාක්ෂණ සේවා අංශයේ උන්නතියට බොහෝ සෙයින් ඉවහල් විය. මෙසේ ඉදිකළ තොරතුරු තාක්ෂණ කලාප තුළ මෘදුකාංග නිෂ්පාදනය කරන සමාගම්වලට අවශ්‍ය පහසුකම් සැලසීමට අමතරව, තම ශක්‍යතාව පුළුල් කරමින්, තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු තාක්ෂණය සම්බන්ධ අනෙකුත් සේවා සැපයීම සඳහා අළුතින් එක්වන ආයතනවල පහසුව උදෙසා, අවශ්‍ය සියළුම යටිතල පහසුකම්වලින් සමන්විත ඒකක (Incubation Centres) සපයා ඇත. 2009 වසර 'තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂාවේ වසර' ලෙස නිල වශයෙන් ප්‍රකාශ කිරීමත් සමගම, දැනට ප්‍රයෝජනයට නොගත් අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමට දැනටමත් සුදුසුකම් ලත් වෘත්තිකයන්ගෙන් පරිපූර්ණ වූ තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ අනෙකුත් සේවාවන් සපයන ආයතනවලට හැකිවන අතර, ගිණුම්කරණය හා නීතිය වැනි බාහිර මූලාශ්‍ර වෙත පැවරෙන අංශයන්ටද විශේෂඥ පුහුණුව ලබාදීම තුළින්, මෙම අංශයේ හැකියාවන් තවදුරටත් වැඩිවනු ඇත.

**කෙසේ වුවත්, ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපය වැනි ප්‍රධාන වෙළෙඳපොළවල ආර්ථික මන්දගාමීත්වය හේතු කොටගෙන ඉදිරි වර්ෂවල දී මෙම අංශයේ වර්ධනය අඩුවීමක් බොහෝ දුරට සිදු විය හැක.** පසුගිය මාස කිහිපය පුරා මෙම වෙළෙඳපොළවල්හි සිදුවූ සේවක අත්හිටුවීම් ඉහළයාම සහ එක්සත් ජනපද රජය විසින් අක්වෙරළ මූලාශ්‍රවලට වඩා දේශීය නිෂ්පාදන රැක ගැනීමට ගත හැකි ආරක්ෂණවාදී පියවරයන් තුළින් ශ්‍රී ලංකාවේ ද තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවන් සඳහා ඇති ඉල්ලුමට බාධා පැමිණිය හැක.

### ආදායම් ලැබීම් සහ ගෙවීම්

**2007 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 358 සමඟ සැසඳීමේ දී, ආදායම් ගිණුමේ හිඟය 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 972 දක්වා පුළුල් වී ඇත.** වර්ෂය තුළ දී අඩු වෙමින් පැවැති ගෝලීය පොලී අනුපාත සහ නිල සංචිත ක්‍රමිකව පහළයාම හේතුවෙන්, 2008 වසරේ දී නිල සංචිත ආයෝජනයෙන් ලද පොලී ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 96 දක්වා සියයට 9 කින් පමණ පහත වැටුණි. ඊට අමතරව, 2008 වසරේ දී එ.ජ.ඩොලරය, යූරෝ සහ බ්‍රිතාන්‍ය පවුම් වැනි අනිකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව විශාල වශයෙන් අධිප්‍රමාණය වීම සහ සුරැකුම්පත්වල වෙළෙඳ වටිනාකම පිරිහීම හේතුවෙන්, පවතින වෙළෙඳ වටිනාකම් අනුව විදේශ සංචිත, එ.ජ.ඩොලර් වටිනාකම අනුව තක්සේරු කිරීමේ දී අඩු අගයක් පෙන්වීය. එසේම, 2008 වසරේ දී පැවැති පහළ මට්ටමේ ගෝලීය පොලී අනුපාත හේතු කොට ගෙන, වාණිජ බැංකු ඇතුළු පෞද්ගලික අංශයේ විදේශ මූල්‍ය වත්කම්වලින් ලද ඉපැයීම් ද පහත වැටුණි. මේ අතර, පෙර ලබා ගත් ණය ප්‍රමාණය ඉහළයාම හේතුවෙන් විදේශ ණය මත ගෙවනු ලබන පොලී ගෙවීම් මෙම වසර තුළ දී ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2008 වසරේ ආදායම් ගිණුමේ ගෙවීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 940 දක්වා සියයට 17 කින් පමණ ඉහළ ගියේය. විදේශීය සෘජු ආයෝජනවලින් විදේශ ආයෝජකයින් ඉපයූ ලාභ සහ ලාභාංශ සිය රට වෙත ගෙනයාම් ද, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 470 ක් දක්වා සියයට 35 කින් පමණ සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වෙතත්, සිය රට වෙත ගෙනයන ලාභ සහ ලාභාංශ තුල, විදේශීය සෘජු ආයෝජන ව්‍යාපාරවල පවතින මෙහෙයුම් තවදුරටත් පුළුල් කිරීම සඳහා රඳවාගත් ලාභ නැවත ආයෝජනය කිරීම ද ඇතුළත් වේ.

### ජංගම සංක්‍රාම

**2008 වසරේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සියයට 16.7 ක ඉහළ වේගයකින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,918 දක්වා වර්ධනය විය.** මෙම ඉහළයාමට මූලිකවම හේතු වූයේ 2008 වසරේ දී විදේශ සේවා

නියුක්තිය සඳහා පිටත්ව ගිය ගණන සියයට 16 කින් වර්ධනය වීම, ඛණිජ තෙල් නිපදවන රටවල ආදායම ඉහළයාම තුළින් මැද පෙරදිග කලාපයේ සාමාන්‍ය වැටුප් ඉහළයාම සහ දකුණු කොරියාව, මැලේසියාව හා සිංගප්පූරුව වැනි ඉහළ වැටුප් ගෙවන රටවලට පිටත්ව ගිය සේවා නියුක්තිකයන්ගේ ගණන ඉහළ යාමත් ය. එසේම, එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා බලකාය සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා සෙබළුන් සහභාගීවීම නිසා ද ප්‍රේෂණ ගලාඒම වර්ධනය විය. බැංකු ශාඛා හරහා මුදල් හුවමාරු කිරීමේ වාසි පිළිබඳ විදේශ සේවා නියුක්තිකයින් දැනුවත් කිරීම තුළින් ප්‍රේෂණ වැඩි කිරීමට මහ බැංකුවේ මඟ පෙන්වීම යටතේ වාණිජ බැංකු ගනු ලැබූ නව පියවර සහ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වැඩි පිරිසක් සිටින ප්‍රධාන විදේශ රටවල අමතර බැංකු කාර්යාල ඇති කිරීම වැනි කරුණු, 2008 වසරේ දී ප්‍රේෂණ වැඩි වීමට හේතු වී ඇත.

**පවත්නා ගෝලීය ආර්ථික අවපාතය හේතුවෙන්, විදේශයන්හි ඉහළ වැටුප් උපයන ඇතැම් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ රැකියා අතිරික්ත ගණයට ඇතුළත් වීමට බොහෝදුරට ඉඩ ප්‍රස්ථා ඇත.** කෙසේ වුවත්, ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් සියයට 68 ක් නුපුහුණු ශ්‍රමිකයන් ලෙස සේවයේ නිරත වන අතර, පිළිවෙලින් සියයට 24 ක් සහ සියයට 8 ක් පුහුණු හා අර්ධ පුහුණු සහ වෘත්තීමය රැකියාවල නිරත වේ. තවද, ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් සියයට 85 කටත් වඩා මැද පෙරදිග රටවල සේවය කරන අතර, අර්බුදයට ලක්ව ඇති යුරෝපය සහ අනිකුත් බටහිර රටවල සේවයේ නිරත වන්නේ සුළු ප්‍රතිශතයකි. ලෝක ආර්ථික අර්බුදයේ බලපෑමට ලක්ව ඇති රටවල ඉතා සුළු පිරිසක් සේවය කිරීම මෙන්ම අඩු වැටුප් උපයන රැකියාවන්හි බහුතරයක් නිරතවීම නිසා, 2009 වසරේ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ගලා ඒම් සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### ජංගම ගිණුම

**ජංගම ගිණුමේ හිඟය 2007 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,401 ක සිට 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,775 දක්වා දෙගුණයකට වඩා අධික අගයක් ගැනීම සඳහා අනපේක්ෂිත ලෙස ඉහළ ගිය ආනයන වියදම් හේතුවෙන් වැඩි වූ වෙළෙඳ හිඟය බලපෑවේය.** ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 2007 වසරේ දී වාර්තා වූ සියයට 4.3 ක සිට 2008 වසරේ දී සියයට 9.3 දක්වා වැඩි විය. 2008 වසර අවසානයේ දී වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,871 ක් ලෙස වාර්තා වීමට වර්ෂය ආරම්භයේ දී වාර්තා වූ ඓතිහාසික ඉහළ ඛනිජ තෙල් සහ අනෙකුත් වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් හේතු විය. කෙසේ වුවත්, පුළුල් වූ ජංගම ගිණුමේ හිඟය සමනය කිරීමට විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල වර්ධනය සහ සේවා අංශයේ ඉහළ කාර්යසාධනය ඉවහල් විය. පුළුල් වන ජංගම ගිණුමේ හිඟය මගින් රටෙහි ආයෝජන සහ ඉතිරි කිරීම අතර පරතරය පිළිබිඹු වේ. එළැඹ‍යි දිගුකාලීන ආයෝජන සඳහා ප්‍රමාණවත් තරම් ඉතුරුම් නොමැති වීම ඉදිරි වසරවල දී ඉහළ ආර්ථික වර්ධන වේගයක් අඛණ්ඩව අත්කර ගැනීම සඳහා විදේශීය ප්‍රාග්ධනය විශාල ප්‍රමාණයක් ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබිඹු කරයි.

## 5.5 ප්‍රාග්ධන සහ මූල්‍ය ප්‍රවාහ සහ ගෙවුම් තුලනය

### විදේශීය සෘජු ආයෝජන

**ඉහළ ගිය ඉපැයීම් නැවත ආයෝජනය කිරීම ප්‍රධාන කොටගෙන, 2008 වසරේ දී, විදේශීය සෘජු ආයෝජන මේ දක්වා ලැබූ ඉහළම අගය වාර්තා කිරීමට සමත් විය.** උපාය මාර්ගික තෝරා ගැනීමක් ලෙස විදේශ ආයෝජකයන් ඔවුන්ගේ ඉපැයීම් නැවත රට තුළ ආයෝජනය කිරීම ඉහළයෑමෙන් ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික අපේක්ෂාවන් සහ ආරක්ෂක තත්ත්වය වඩාත් යහපත් වීම කෙරෙහි විදේශ ආයෝජකයන්ගේ විශ්වාසනීයත්වයේ ඇති වූ ඉහළයෑම පිළිබිඹු කෙරේ. ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ බොහෝ රටවල් හට නව විදේශීය ආයෝජන ආකර්ෂණය කිරීමේ දී දැඩි අසීරුතාවයන්ට මුහුණපෑමට සිදුවිය. මේ හේතුවෙන් විදේශ ආයෝජකයින් විසින් විශේෂයෙන් මෙවැනි අර්බුදකාරී තත්ත්වයන් හමුවේ වුවද ඔවුන්ගේ ඉපැයීම් නැවත ව්‍යාපාරවල ආයෝජනය කිරීම, ශ්‍රී ලංකා ආර්ථිකයේ අනාගත අපේක්ෂාවන් කෙරෙහි දැක්වූ දැඩි විශ්වාසය පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස,

**5.8 රූප සටහන** ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුමේ ප්‍රධාන ලැබීම්



විදේශ ණය ද ඇතුළුව ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම්වලට ලැබූ දළ විදේශීය සෘජු ආයෝජන, වාර්තාගත මට්ටමකට ළඟාවෙමින් 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 889 ක් ලෙස වාර්තා වූ අතර, එය 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 734 ක් විය. 2008 වසරේ වාර්තා වූ විදේශීය සෘජු ආයෝජන තුළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 131 ක හිමිකම් ප්‍රාග්ධනය ද, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 110 ක කොටස් හිමියන්ගේ ණය සහ අත්තිකාරම් ද, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 101 ක අන්තර් සමාගම් ණය ද, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 137 ක විදේශීය ණය ද, සමාගම්වල රඳවාගත් ඉපැයීම් නැවත ආයෝජනය කිරීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 410 ක් ද ඇතුළත් විය. මේ අතර, දේශීය සමාගම් කිහිපයක් විදේශයන්හි ආයෝජනය කිරීම හේතුවෙන් 2008 වසර තුළ දී විදේශීය සෘජු ආයෝජන යෙදවීම් 2007 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 55 ක සිට 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 62 ක් දක්වා ඉහළ ගියේය.

**ආයෝජන මණ්ඩලය විසින් අනුමත කළ ව්‍යාපෘතීන් ගණනෙහි සාමාන්‍ය අඩුවීමක් දක්නට ලැබුණද, 2008 වසර තුළ දී ආයෝජන මණ්ඩලය විසින් මහා පරිමාණ ව්‍යාපෘතීන් කිහිපයක් අනුමත කිරීම ප්‍රධාන කොටගෙන එකඟ වූ විදේශ ආයෝජන වටිනාකම ඉහළ යන ලදී.** විශේෂයෙන්ම විදුලි සංදේශ සේවා ඇතුළත් සේවා අංශයේ සහ නිපැයුම් අංශයේ නියුතු ව්‍යාපෘති සඳහා ඉහළ විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණයක් ලැබුණි. වසර තුළ දී වාර්තා වූ ඉහළම විදේශීය සෘජු ආයෝජනය වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 150 ක් මැලේසියාවෙන් වාර්තා වූ අතර, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 126 ක ආයෝජන වාර්තා කරමින් ඉන්දියාව දෙවැනි විශාලතම ආයෝජකයා බවට පත්විය.

**විදේශීය සෘජු ආයෝජනවල දිගුකාලීන පැවැත්මේ ස්වභාවය හේතු කොටගෙන එය අනිකුත් කෙටි කාලීන මූල්‍ය ප්‍රවාහවලට වඩා වැඩි වැදගත්කමකින් යුක්ත වේ.** විදේශීය සෘජු ආයෝජනවලට වඩා වෙනස් වූ සමපේක්ෂණ ස්වභාවයෙන් යුත් කෙටිකාලීන විදේශීය මූල්‍ය ප්‍රවාහ අර්බුදකාරී තත්ත්වයන් තුළ දී ක්ෂණිකව ආපසු රටින් බැහැරව යෑම පිළිබඳ ඉහළ අවදානමකින් යුක්ත වේ. එම නිසා, අවශ්‍ය නවීනතම යටිතල පහසුකම් ලබාදීම, දේපළ හිමිකම් සුරැකීම, නව ආයෝජකයන් සඳහා ඉඩම් කඩිනමින් වෙන් කිරීම, පරිපූර්ණ හා කාර්යක්ෂම ආකාරයෙන් ගැටලු නිරාකරණය කිරීම සහ ශ්‍රම සංචලනය පහසු කිරීම ආදිය තුළින් විදේශීය සෘජු ආයෝජන දිරිගැන්වීම සඳහා ශක්තිමත් නිදහස් පරිසරයක් නිර්මාණය කිරීම, විදේශීය සෘජු ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට අත්‍යවශ්‍ය වේ.

## රජයට ලැබුණු ණය ප්‍රාග්ධනය

### මැදි සහ දිගුකාලීන

**විදේශ පාර්ශ්වයන් විසින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘතීන් සඳහා රජය විසින් සපයාගත යුතු ණය ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් අඩපණ වීම නිසා විදේශ ණය සහ ප්‍රදානයන්ගෙන් සැදුම්ලත් රජයට ලැබුණු විදේශීය ලැබීම්, 2008 වසර තුළ දී පහත වැටුණි.** වසරේ අග භාගය වන විට ගෝලීය මූල්‍ය අර්බුදය උග්‍ර අතට හැරීම හේතු කොටගෙන සමහර වාණිජ්‍යමය ණය ලබාගැනීමට නොහැකි වුවද, 2008 වසර තුළ දී රජය එ.ජ.ඩොලර් බිලියන 1.4 ක් වූ විදේශීය ණය සහ ප්‍රදාන රැස් කරගැනීමට සමත් වූ අතර, 2007 වසර තුළ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 500 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවේ ලැබීම් ද ඇතුළත්ව රජයට ලැබුණු ණය සහ ප්‍රදාන එ.ජ.ඩොලර් බිලියන 1.6 ක් විය. වසර තුළ දී රජයට ලැබුණු මුළු මැදි සහ දිගුකාලීන ණය ප්‍රවාහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,059 ක් වූ අතර, එය 2007 වසර තුළ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,290 ක් විය. 2008 වසර තුළ දී ලද මුළු ණය ප්‍රමාණයෙන්, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 604 ක් (සියයට 57 ක්) සහනදායී කොන්දේසි යටතේ ලැබුණු අතර, එ.ජ.ඩොලර් 455 ක් (සියයට 43 ක්) සහනදායී නොවන වාණිජ්‍යමය කොන්දේසි යටතේ ලැබුණි. සහනදායී කොන්දේසි මත ලැබූ ණය ප්‍රවාහවලින් වැඩි ප්‍රමාණයක් කොළඹ වරාය පුළුල් කිරීම, දකුණු අධිවේගී මාර්ගය ඉදිකිරීම සහ හම්බන්තොට නව වරාය ඉදිකිරීම වැනි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට යොමු කරනු ලැබීය. මහා පරිමාණ ව්‍යාපෘතීන් කඩිනමින් ක්‍රියාත්මක කළ ද, මෙම වසර තුළ දී නව ව්‍යාපෘතීන් සඳහා ලබා දුන් නව විදේශ ආධාර සහතිකවීම්වල සිදුවූ ඉහළයෑම හේතුවෙන් ණය උපයෝජන අනුපාතය[1] 2007 වසරේ දී වාර්තාකළ සියයට 20.6 ක සිට 2008 වසරේ දී සියයට 20.5 ක් දක්වා ආන්තික වශයෙන් අඩු විය. මේ අතර, පැරිස් කණ්ඩායමේ (Paris Club) සාමාජිකයින් 2005 වසරේ දී ලබා දුන් ණය ගෙවීම් පමා කිරීමේ පහසුකම අවසන්ව 2006 වසරේ සිට වාරික 7 කින් මෙම ණය නැවත ගෙවීම ආරම්භ කිරීම සහ රජයේ වාණිජමය ණය ආපසු ගෙවීම් හේතුවෙන් රජයේ දිගුකාලීන ණය ගෙවීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 807 ක් දක්වා සියයට 30.6 කින් ඉහළ ගියේය. ජංගම සහ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් සැදුම්ලත් මුළු ප්‍රදානයන් 2007 වසර තුළ දී වාර්තාකළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 277 සමඟ සසඳන විට 2008 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 289 ක් දක්වා ඉහළ ගියේය. 2008 වසර තුළදී ද සුනාමි ආපදාවෙන් විනාශ වූ යටිතල පහසුකම් නැවත

(1) ණය උපයෝජන අනුපාතය ගණනය කර ඇත්තේ 2008 ජූනි මස අවසානය වන විට එකගවී ඇති එහෙත් මුදා නොහරින ලද විදේශාධාරවල වටිනාකමින්, 2008 වසර තුළ මුදාහරින ලද විදේශාධාරවල වටිනාකම ප්‍රතිශතයක් ලෙස ගැනීමෙනි.

5.9 සංඛ්‍යා සටහන

## 2008 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘතීන්

| ආයකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් දශ ලක්ෂ |
|---|---|
| **ආසියානු සංවර්ධන බැංකුව** | **247.0** |
| එයින්; කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 42.9 |
| බලශක්ති සංවර්ධන ව්‍යාපෘතිය | 21.4 |
| දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක | 19.2 |
| අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රජා ජල සහ සනීපාරක්ෂණ ව්‍යාපෘතිය - අතිරේක 1 | 16.7 |
| අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රජා ජල සහ සනීපාරක්‍ෂණ ව්‍යාපෘතිය | 15.3 |
| රාජ්‍ය මූල්‍ය කළමණාකරන වැඩ සටහන | 15.0 |
| දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය-අතිරේක | 11.9 |
| ජාතික අධිවේගී මාර්ග පද්ධති ව්‍යාපෘතිය | 11.0 |
| **ඔස්ට්‍රියා ක්‍රෙඩිටාන්ස්ටෝල්ට් බැංකුව** | **27.7** |
| එයින්; පාලම් පහක් ඉදිකිරීම මගින් මාර්ග යටිතල පහසුකම් පුළුල් කිරීමේ සහ ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | 9.7 |
| **ඩැන්ස්ක් බැංකුව** | **14.1** |
| එයින්; දකුණු නුවර ජල සැපයුම් ව්‍යාපෘතිය | 14.1 |
| **යුරෝපීය ආයෝජන බැංකුව** | **28.7** |
| එයින්; ඩී.එෆ්.සී.සී. ගෝලීය ණය පහසුකම් II | 15.1 |
| **ප්‍රංශය** | **20.8** |
| එයින්; ත්‍රිකුණාමල ඒකාබද්ධ යටිතල පහසුකම් ව්‍යාපෘතිය (TIIP) | 10.7 |
| **ජපානය** | **262.9** |
| එයින්; දක්ෂිණ අධිවේගී මාර්ගය ගොඩනැගීමේ ව්‍යාපෘතිය | 60.7 |
| ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය | 57.0 |
| පළාත්බද මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 17.6 |
| වළවේ වම් ඉවුරු වාරිමාර්ග සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 16.9 |
| බලශක්ති ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘතිය (කෙරවලපිටිය) | 16.1 |
| පාරිසරික හිතකාමී විසඳුම් ලබාදීමේ අරමුදල II | 12.1 |
| ලුනාව පාරිසරික සහ ජන සංවර්ධන ව්‍යාපෘතිය | 11.8 |
| දිළිඳු ජනතාවට හිතකර වූ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | 11.4 |
| කොළඹ නගරය සඳහා විදුලිබල දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය | 10.7 |
| මහ කොළඹ සඳහා කළු ගඟ ජල සැපයුම් ව්‍යාපෘතිය | 10.2 |
| **මහජන චීන සමූහාණ්ඩුව** | **40.4** |
| එයින්; වරණීය ගැනුම්කරුවන්ගේ ණය | 23.2 |
| ඩීසල් බහු ඒකක 15 ක් සැකසීමේ ව්‍යාපෘතිය | 10.6 |
| **එච්.එස්.බී.සී. බැංකුව (එක්සත් රාජධානිය)** | **32.4** |
| එයින්; ප්‍රාදේශීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 23.4 |
| **එච්.එස්.බී.සී. බැංකුව (හොංකොං)** | **26.3** |
| එයින්; ප්‍රාදේශීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 26.3 |
| **අන්තර්ජාතික සංවර්ධන සංගමය** | **95.3** |
| එයින්; මාර්ග පද්ධති ආධාරක ව්‍යාපෘතිය | 45.2 |
| උතුරු නැගෙනහිර නිවාස නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 20.2 |
| **ස්පාඤ්ඤ රාජධානිය** | **20.1** |
| එයින්; ගාල්ල සහ මීගමුව ප්‍රදේශවල ජල පවිත්‍රාගාර දෙකක් නිර්මාණය කිරීම සහ පිහිටුවීම | 13.5 |
| **නෝර්ඩියා බැංකුව (ඩෙන්මාර්කය)** | **28.6** |
| එයින්; ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 15.8 |
| කැළණි දකුණු ඉවුරු ජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය | 12.8 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ගොඩනැගීම සඳහා සැලකිය යුතු ප්‍රදානයන් ප්‍රමාණයක් රජය වෙත ලැබුණි.

### කෙටිකාලීන

**භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් විදේශිකයින්ගෙන් ලද ශුද්ධ කෙටිකාලීන මූල්‍ය ප්‍රවාහ වසරේ දී වාර්තා වූ ඉහළම මට්ටම වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 185 ක් ලෙස 2008 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට පැවැතුණි.** එසේ වුවත්, ගෝලීය මූල්‍ය අර්බුදය උග්‍ර අතට හැරීමත් සමඟම විදේශ ආයෝජකයින් විසින් ඔවුන්ගේ කෙටිකාලීන ආයෝජන ඉවත් කරගැනීම හේතුවෙන් 2008 සැප්තැම්බර් මස අග භාගය වන විට වාර්තා වූ මෙම ශුද්ධ කෙටිකාලීන ලැබීම්, ඉතා කෙටි කාලයක් තුළ දී ඉවත්ව ගොස් 2008 වසරේ අවසානය වන විට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 213 ක ශුද්ධ කෙටිකාලීන ගෙවීම් බවට පත්විය. 2008 වසරේ දී රජයේ භාණ්ඩාගාර බැඳුම්කර මත වූ ශුද්ධ කෙටිකාලීන ගෙවීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 264 ක් ලෙස වාර්තා වූ අතර, එය 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 372 ක ශුද්ධ කෙටිකාලීන ලැබීම් ලෙස වාර්තා විය. 2008 වසරේ මැයි මාසයේ දී ප්‍රාග්ධන ගිණුම තවදුරටත් විවෘත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, රජය විසින් භාණ්ඩාගාර බිල්පත්වල නොපියවා ඇති වටිනාකමින් සියයට 10 ක් දක්වා විදේශිකයින් හට ආයෝජනය කිරීමට අවසරය ලබා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩාගාර බිල්පත්වල විදේශිකයන්ගේ ශුද්ධ ආයෝජන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 51 ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, කෙටිකාලීන ප්‍රාග්ධන ලැබීම් ලෙස වර්ගීකරණය කරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල විදේශීය ආයෝජන, ගෝලීය මූල්‍ය වෙළෙඳපොළේ උච්ඡාවචනයන්ට අනුකූලව ක්ෂණිකව වෙනස්වීමේ නැඹුරුතාවයක් පෙන්නුම් කරයි. 2008 වසරේ සැප්තැම්බර් මස සිට ගෝලීය මූල්‍ය අර්බුදය උග්‍ර අතට හැරීම භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ඇති විදේශීය ආයෝජනයන්, ආයෝජකයන් විසින් මුදල් කර නැවත රැගෙනයාම තීව්‍ර කිරීමට ඉවහල් විය. 2008 ඔක්තෝබර් සිට දෙසැම්බර් කාලය තුළ දී විදේශිකයින් විසින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 430 ක වටිනාකමක් සහිත භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල තිබූ ආයෝජනයන් ඉවත් කර ගනු ලැබීය. මෙම භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ඇති කෙටිකාලීන ආයෝජනයන් මුදල් කර නැවත රැගෙන යාමේදී ඇති වන ක්ෂණික විදේශ විනිමය අවශ්‍යතාවය සපුරාලීමට සහ විදේශීය ආයෝජකයන් අතර විශ්වසනීයත්වයක් ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම විදේශ විනිමය රැගෙන යාමේදී මතු වන විදේශ විනිමය අවශ්‍යතාවයන් සැපයීම සඳහා පිහිටුවා තිබූ නිදන් අරමුදල (Sinking Fund) භාවිතා කරන ලද අතර, එමගින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මත ඇති විය හැකිව තිබූ අනවශ්‍ය පීඩනය සමනය කිරීමට ද හැකි විය.

## පෞද්ගලික අංශයට සහ රාජ්‍ය සංස්ථාවලට ලැබුණු ණය ප්‍රාග්ධනය

### දිගුකාලීන

**පෞද්ගලික අංශයට ලැබුණු දිගුකාලීන ණය ප්‍රවාහ 2008 වසර තුළ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 265 ක් දක්වා සියයට 33.2 කින් ඉහළ ගියේය.** 2008 වසර තුළ දී දේශීය පොලී අනුපාතිකය සාපේක්ෂ ලෙස ඉහළ අගයක් ගැනීම හේතුවෙන් විශේෂයෙන්ම විදුලිබල හා බලශක්ති, විදුලි සංදේශ සහ මූල්‍ය අංශයන්හි නියුතු ආයෝජන මණ්ඩලය අනුමත කළ ව්‍යාපාර කිහිපයක් ඇතුළුව බොහොමයක් පෞද්ගලික අංශයේ ව්‍යාපාර ඔවුන්ගේ වත්මන් ව්‍යාපාරික කටයුතු පුළුල් කරගැනීම සඳහා විදේශීය ණය ලබා ගැනීම මෙසේ පෞද්ගලික අංශයේ විදේශ ණය ලබා ගැනීම් ඉහළයෑමට හේතු විය.

### කෙටිකාලීන

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා ඉරානයෙන් ලබා දුන් කෙටිකාලීන වෙළෙඳ ණය විශාල ලෙස හේතු කොටගෙන, 2008 වසරේ දී, කොටස් වෙළෙඳපොළ විවිධ ආයෝජනයන්, පෞද්ගලික අංශයේ කෙටිකාලීන වෙළෙඳ ණය සහ වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම්වල ඇතිවූ වෙනස්වීම් ඇතුළත් පෞද්ගලික අංශයට සහ රාජ්‍ය සංස්ථාවලට ලැබුණු මුළු කෙටිකාලීන මූල්‍ය ප්‍රවාහය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 679 ක් දක්වා ඉහළ ගිය අතර, එය 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 205 ක් ලෙස වාර්තා විය.** 2008 වසර තුළ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඉරානයෙන් ලද ඛනිජ තෙල් ආනයන මත වූ ශුද්ධ වෙළෙඳ ණය ලැබීම් වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 381 ක් ද ඇතුළුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබූ මුළු ශුද්ධ කෙටිකාලීන වෙළෙඳ ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 601 ක් විය.

**එ.ජ.ඩොලර් දශ ලක්ෂ 548 ක වාර්තාගත දළ මූල්‍ය ප්‍රවාහ ලැබීම් මධ්‍යයේ වුව ද කොටස් වෙළෙඳපොළට ලද ශුද්ධ විවිධ ආයෝජන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 60 ක් දක්වා 2008 වසර තුළ දී අඩු වූ අතර, එය 2007 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 101 ක් ලෙස වාර්තා විය.** මෝටර් රථ වෙළෙඳාම, බැංකු හා මූල්‍ය, රක්ෂණ සහ විදුලි සංදේශ යන අංශයන්හි නියුතු සමාගම් විශාල

ලෙස කොටස් වෙළෙඳපොළවලට විදේශ ආයෝජනයන් ආකර්ෂණය කරගැනීමට සමත් විය. ඇසෝසියේටඩ් මෝටර්වේස් (AMW) සමාගම මුළුමනින්ම විදේශීය සමාගමකට විකිණීම, ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) සමාගමේ තිබූ නිපොන් ටෙලිකොමියුනිකේෂන් සහ ටෙලි ග්‍රාෆ් (NTT) සමාගම සතු කොටස් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ සුළු කොටස් හිමියන්ගේ කොටස් ග්ලෝබල් ටෙලිකොමියුනිකේෂන් හෝල්ඩින්ග්ස් (GTH) ආයතනය වෙත විකිණීම තුළින් කොළඹ කොටස් වෙළෙඳපොළ තුළට ඉහළ විදේශ මූල්‍ය ප්‍රවාහයන් ආකර්ෂණය කරගැනීමට සමත් විය. කොළඹ කොටස් වෙළෙඳපොළ තුළින් ප්‍රාග්ධන රැගෙන යෑම් ද 2008 වසර තුළ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 488 ක් දක්වා ඉහළ ගිය අතර, ඒ සඳහා නිපොන් ටෙලිකොමියුනිකේෂන් සහ ටෙලි ග්‍රාෆ් සමාගම සතු ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ කොටස් විකිණීම හේතු විය.

**විදේශවල ආයෝජනය කර තිබූ විදේශ වත්කම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වැනි දේශීය වත්කම්වලට පරිවර්තනය කිරීම හේතුවෙන් 2008 වසර තුළ දී වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 210 කින් පහළ ගියේය.** මේ අතර, වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වගකීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 185 කින් පහළ ගිය අතර, ඒ සඳහා දේශීය සහ අක්වෙරළ බැංකු ඒකකවල පැවැති විදේශ විනිමය තැන්පතුවල අඩුවීම බලපාන ලදී.

### ගෙවුම් තුලනය

**පසුගිය වසර තුන තුළ දී ගෙවුම් තුලනයේ වාර්තා වූ අඛණ්ඩ අතිරික්තය, 2008 වසර අවසානයේදී ගෙවුම් තුලනයේ හිඟයක් බවට පත්විය.** වසරේ පළමු කාර්තු තුන තුළ දී පැවැති හිතකර බාහිර වාතාවරණය හේතුවෙන් පළමු කාර්තු තුන අවසානයේ ගෙවුම් තුලන අතිරික්තයක් වාර්තා වූ අතර, 2008 ජූලි මස අග දී ගෙවුම් තුලනයේ අතිරික්තය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 515 ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, 2008 සැප්තැම්බර් මස දී, ලෝක මූල්‍ය අර්බුදය තීව්‍ර වීමත් සමඟ විදේශීය අංශයේ එතෙක් පැවැති හිතකර වර්ධනය කෙරෙහි බාධා ඇති විය. මෙම අර්බුදය, විදේශ ආයෝජකයන් තමන් සතු භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ආපසු ගැනීමටත්, කෙටිකාලීන ණය පහසුකම් ඉක්මණින් ආපසු ගෙවීමට සිදුවීමත්, වාණිජ්‍යාමය ණය ලබා ගැනීමේ මාර්ග ක්ෂණික ලෙස හිඟ වීම සහ ප්‍රධාන ජාත්‍යන්තර මුදල් එ.ජ.ඩොලරයට එරෙහිව අවප්‍රමාණයවීම හේතුවෙන් සංචිත තක්සේරුවේ දී වන පාඩු වැඩිවීමත් යන කාරණා ප්‍රබල ලෙස බලපෑවේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2008 වර්ෂය අවසාන වන විට, සමස්ත ගෙවුම් තුලන හිඟය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,225 ක් ලෙස වාර්තා විය.

### විදේශ සංචිත

**වසරේ පළමු කාර්තු තුන තුළ විශාල කාල පරාසයක් තුළ දී, මාස 3 ක ආනයන පියවීමටත් වඩා ප්‍රමාණවත් වන පරිදි දළ නිල සංචිත ඉහළ මට්ටමක පැවැතිණි.** 2008 ජූලි මස වන විට ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත් නොවූ විදේශීය දළ නිල සංචිත, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,558 ක් වූ වාර්තාගත අගයක් පෙන්නුම් කළ අතර, එය මාස 3.2 ක ආනයන පියවීම සඳහා ප්‍රමාණවත් විය. කෙසේ වුවද, එතැන් සිට, ලෝක මූල්‍ය අර්බුදය උග්‍ර වීමත් සමඟ මුළු විදේශ විනිමය ලැබීම්වලට සාපේක්ෂව මුළු විදේශ විනිමය ගෙවීම් ඉහළයාම හේතුවෙන් දළ නිල සංචිත ද ක්‍රමයෙන් අඩු විය. 2008 වසර අවසානයේ ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත්ව සහ ඇතුළත් නොවූ දළ නිල සංචිත පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,561 ක් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,753 ක් ලෙස වාර්තා විය. මේ අනුව, 2008 වසර අවසානයේ දී ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත් සහ ඇතුළත් නොවූ විදේශ සංචිත ප්‍රමාණය පිළිවෙළින් ආනයනික මාස 2.2 ක් සහ මාස 1.5 ක් දක්වා අඩු විය. විදේශ වත්කම්වල ප්‍රමාණාත්මකභාවය, දළ නිල විදේශ වත්කම්, කෙටිකාලීන ණය සහ වගකීම්වල ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2007 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 79 සිට 2008 වසර අවසානයේ දී සියයට 45 දක්වා පහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ නිල සංචිත අඩු වීමය. මේ අතර, ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ද ඇතුළත්ව රටෙහි මුළු සංචිත ප්‍රමාණය 2008 වර්ෂයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,799 දක්වා පහළ ගියේය.

**5.9 රූප සටහන** — **කාර්තුමය විදේශ සංචිත**



**5.10 සංඛ්‍යා සටහන** **ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් (අ)**

| හිමිකාරිත්වය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ (ආ) | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2004 | 2005 | 2006 | 2007 | 2008 (ඇ) | 2004 | 2005 | 2006 | 2007 | 2008 (ඇ) |
| 1. රජය | 95 | 131 | 128 | 99 | 87 | 9,897 | 13,417 | 13,789 | 10,768 | 9,866 |
| 2. රාජ්‍ය නියෝජ්‍යායතනවය | - | - | - | - | - | - | - | - | - | - |
| 3. මහ බැංකුව | 2,101 | 2,604 | 2,709 | 3,409 | 2,474 | 219,795 | 265,873 | 291,747 | 370,640 | 279,870 |
| 4. මුළු නිල වත්කම් | 2,196 | 2,735 | 2,837 | 3,508 | 2,561 | 229,693 | 279,290 | 305,536 | 381,408 | 289,736 |
| 5. වාණිජ බැංකු | 1,243 | 1,466 | 1,169 | 1,448 | 1,238 | 129,987 | 149,656 | 125,867 | 157,454 | 140,075 |
| 6. මුළු විදේශීය වත්කම් | 3,438 | 4,201 | 4,005 | 4,956 | 3,799 | 359,680 | 428,946 | 431,403 | 538,862 | 429,810 |
| 7. දළ නිල වත්කම් මගින් කළ හැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 7.1 වෙළෙඳ භාණ්ඩ | 3.3 | 3.7 | 3.3 | 3.7 | 2.2 | | | | | |
| 7.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 2.9 | 3.3 | 2.9 | 3.3 | 2.0 | | | | | |
| 8. මුළු වත්කම් මගින් කළ හැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 8.1 වෙළෙඳ භාණ්ඩ | 5.2 | 5.7 | 4.7 | 5.3 | 3.3 | | | | | |
| 8.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 4.5 | 5.0 | 4.1 | 4.7 | 2.9 | | | | | |

(අ) සංචිත ගණනය කර ඇත්තේ වෙළෙඳපොළ වටිනාකම අනුව සහ ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ද ඇතුළත්වය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයින්ට අනුව පරිවර්තනය කර ඇත.

| වසර අවසානයේ දී | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|---|
| එ.ජ. ඩොලරයකට රුපියල් | 104.61 | 102.12 | 107.71 | 108.72 | 113.14 |

(ඇ) තාවකාලික

විදේශ සංචිත සැලකිය යුතු මට්ටමකට නැවත ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2009 වසරේ දී ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබුවේය. ශ්‍රී ලංකා මහ බැංකුව රටවල් තුනක් සමග මුදල් හුවමාරු (SWAP) ගිවිසුම් ඇති කර ගැනීම සඳහා සාකච්ඡා කර ඇත. මෙවැනි ගිවිසුම් මාර්ගයෙන්, 2009 වසරේ මේ දක්වා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 200 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබී ඇත. මීට අමතරව, වෙනත් රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් අතර භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන ප්‍රචලිත කිරීම මෙන්ම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) සහ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම් ඉලක්ක කර තැන්පතු දිරිගැන්වීම සඳහා පොලියෙන් සියයට 20 ක පාරිතෝෂික පොලියක් ගෙවීමට ගත් පියවර ද, සංචිත ඉහළ නැංවීම අරමුණු කොටගත් අනෙකුත් ක්‍රියාමාර්ග ලෙස දැක්විය හැකිය.

තවද, පවත්නා ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ ශ්‍රී ලංකාවට අනුග්‍රහ දැක්වීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉදිරිපත් වීමට ප්‍රතිචාර වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සම්පස්ථ ණය පහසුකමක් ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය බලාපොරොත්තු වේ. මෙම ආධාරය ප්‍රධාන වශයෙන් ගෙවුම් තුලන අවශ්‍යතාවන් සඳහා වන අතර, එමගින් විදේශ සංචිත යළි ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. එවන් මූල්‍ය අනුග්‍රහයක් ලබාගැනීම නිසා අනිකුත් සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සහායයන් ලැබීම වර්ධනය වනවා සේම, ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර ආයෝජකයින්ගේ විශ්වාසය සැලකිය යුතු ලෙස වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.6 විදේශ ණය සහ ණය සේවාකරණය

### විදේශ ණය

මැදි, දිගුකාලීන සහ කෙටිකාලීන ණයවලින් සමන්විත මුළු විදේශ ණය ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, පසුගිය වසර කිහිපය

**5.10 රූප සටහන** **විදේශ ණය**



තුළ දක්නට ලැබුණු අඩුවීමේ ප්‍රවණතාවය පිළිබිඹු කරමින් 2007 වසරේ දී වාර්තා කළ සියයට 43.2 කට සාපේක්ෂව 2008 වසර තුළ දී සියයට 37.1 ක් දක්වා පහළ ගියේය. ප්‍රධාන වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලබා ගත් කෙටිකාලීන ණය සහ අනෙකුත් වෙළෙඳ ණය හේතුකොට ගෙන, 2008 වසරේ මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 15,107 දක්වා සියයට 8 කින් ඉහළ ගියේය. නොපියවූ මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 37.2 ක් පමණ විශේෂ ගැණුම් හිමිකම්වලින් ද (SDR), සියයට 31.1 පමණ ජපන් යෙන්වලින් ද, සියයට 19.6 ක් පමණ එ.ජ.ඩොලර්වලින් ද සමන්විත වේ. මුළු

**5.11 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2004 | 2005 | 2006 | 2007 | 2008 (අ) | 2004 | 2005 | 2006 | 2007 | 2008 (අ) |
| **1. මැදි හා දිගුකාලීන ණය** | **10,699** | **10,690** | **11,347** | **12,879** | **13,646** | **1,119,155** | **1,091,644** | **1,222,175** | **1,400,833** | **1,543,952** |
| 1.1 රජය | 9,523 | 9,354 | 10,245 | 11,744 | 12,593 | 996,203 | 955,207 | 1,103,418 | 1,276,846 | 1,424,729 |
| 1.2 රජය විසින් සහතික කරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 507 | 567 | 465 | 345 | 251 | 52,986 | 57,912 | 50,065 | 37,501 | 28,429 |
| 1.3 රජය විසින් සහතික නොකරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 411 | 388 | 393 | 539 | 634 | 42,944 | 39,588 | 42,376 | 58,553 | 71,715 |
| 1.4 ජා.මූ. අරමුදලින් කළ ගැණුම් | 258 | 381 | 244 | 251 | 169 | 27,023 | 38,937 | 26,316 | 27,933 | 19,079 |
| **2. කෙටිකාලීන ණය** | **647** | **664** | **634** | **1,111** | **1,460** | **67,726** | **67,759** | **68,286** | **120,748** | **165,207** |
| 2.1 රජය (ආ) | - | - | - | 457 | 212 | - | - | - | 49,641 | 24,006 |
| 2.2 අනෙකුත් (ඇ) | 647 | 664 | 634 | 654 | 1,248 | 67,726 | 67,759 | 68,286 | 71,107 | 141,201 |
| **3. බැංකු අංශයේ විදේශීය වගකීම් (ඈ)** | **1,429** | **1,666** | **1,994** | **2,493** | **2,669** | **149,492** | **170,170** | **214,802** | **271,063** | **301,950** |
| 3.1 මහ බැංකුව | 1 | 1 | 3 | 2 | 1 | 128 | 131 | 284 | 219 | 64 |
| 3.2 වාණිජ බැංකු | 1,066 | 1,388 | 1,681 | 2,046 | 1,861 | 111,464 | 141,753 | 181,040 | 222,389 | 210,531 |
| 3.3 ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 362 | 277 | 311 | 446 | 808 | 37,899 | 28,286 | 33,478 | 48,454 | 91,355 |
| **4. මුළු විදේශීය ණය (1+2)** | **11,346** | **11,354** | **11,981** | **13,989** | **15,107** | **1,186,881** | **1,159,403** | **1,290,461** | **1,521,581** | **1,709,159** |
| **5. මුළු විදේශීය ණය සහ වගකීම් (1+2+3)** | **12,775** | **13,020** | **13,976** | **16,483** | **17,775** | **1,336,373** | **1,329,573** | **1,505,263** | **1,792,643** | **2,011,109** |
| **විශේෂිත අයිතමයන්** | | | | | | | | | | |
| **මැදි හා දිගුකාලීන ණය** | | | | | | | | | | |
| ව්‍යාපෘති ණය | 7,702 | 7,416 | 9,084 | 10,002 | 11,148 | 805,646 | 757,262 | 978,356 | 1,087,359 | 1,261,304 |
| ව්‍යාපෘති නොවන ණය | 1,763 | 1,655 | 867 | 1,064 | 740 | 184,467 | 169,038 | 93,331 | 115,697 | 83,703 |
| සැපයුම්කරුවන්ගේ ණය | 240 | 283 | 435 | 679 | 705 | 25,123 | 28,907 | 46,877 | 73,790 | 79,722 |
| ජා.මූ.අරමුදලෙන් කළ ණය | 258 | 381 | 244 | 251 | 169 | 27,023 | 38,937 | 26,316 | 27,933 | 19,079 |
| අනෙකුත් ණය (ඉ) | 735 | 955 | 718 | 884 | 885 | 76,896 | 97,500 | 77,295 | 96,054 | 100,145 |
| **කෙටිකාලීන ණය හා බැංකු අංශයේ විදේශීය වගකීම්** | **2,077** | **2,330** | **2,628** | **3,604** | **4,129** | **217,217** | **237,929** | **283,088** | **391,811** | **467,157** |
| **ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් (උ)** | | | | | | | | | | |
| මුළු විදේශීය ණය | 54.9 | 46.5 | 42.4 | 43.2 | 37.1 | 56.8 | 47.3 | 43.9 | 42.5 | 38.8 |
| බැංකු අංශයේ මුළු විදේශීය වගකීම් | 6.9 | 6.8 | 7.1 | 7.7 | 6.6 | 7.1 | 6.9 | 7.3 | 7.6 | 6.8 |
| මුළු විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම් | 61.8 | 53.3 | 49.4 | 51.0 | 43.7 | 63.9 | 54.2 | 51.2 | 50.1 | 45.6 |
| කෙටිකාලීන ණය | 3.1 | 2.7 | 2.2 | 3.4 | 3.6 | 3.2 | 2.8 | 2.3 | 3.4 | 3.7 |
| කෙටිකාලීන ණය හා බැංකු අංශයේ විදේශීය වගකීම් | 10.0 | 9.5 | 9.3 | 11.1 | 10.1 | 10.4 | 9.7 | 9.6 | 10.9 | 10.6 |
| **මුළු ණයවල ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | | | | | |
| කෙටිකාලීන ණය | 5.1 | 5.1 | 4.5 | 6.7 | 8.2 | 5.1 | 5.1 | 4.5 | 6.7 | 8.2 |
| කෙටිකාලීන වගකීම් | 11.2 | 12.8 | 14.3 | 15.1 | 15.0 | 11.2 | 12.8 | 14.3 | 15.1 | 15.0 |
| **කෙටිකාලීන ණය, නිල විදේශීය සංචිතයෙහි ප්‍රතිශතයක් වශයෙන්** | **29.5** | **24.3** | **22.4** | **31.7** | **41.6** | **29.5** | **24.3** | **24.4** | **31.7** | **43.3** |

(අ) තාවකාලික
(ආ) අනේවාසිකයන් සඳහා නිකුත් කල භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර ඇතුළත් වේ.
(ඇ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉරානයෙන් ලබාගත් ඛනිජතෙල් ආනයන වෙළෙඳ ණය සහ අනෙකුත් වෙළෙඳ ණය ඇතුළත් කොට ඇත.
(ඈ) ආසියානු නිෂ්කාශන සංගමයේ ණය, අක්වෙරළ බැංකු ඒකක සහ වාණිජ බැංකුවල විදේශ වගකීම් ඇතුළත් වේ.
(ඉ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගු කාලීන ණය
(උ) දත්ත ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද ද. දේ. නි. මත පදනම් වේ.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශීය ණය සහ වාණිජ බැංකුවල විදේශීය වගකීම් ඇතුළත් මුළු විදේශ ණය සහ වගකීම්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, 2007 වසරේ වාර්තා කළ සියයට 51 සිට 2008 වසරේ දී සියයට 43.7 දක්වා පහළ ගියේය. වාණිජ බැංකුවල විදේශ වගකීම්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2008 වසරේ දී සියයට 6.6 දක්වා පහළ ගිය නමුත්, එහි නිරපේක්ෂ වටිනාකම 2008 වසර අග දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,669 දක්වා සියයට 7.1 කින් ඉහළ ගියේය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඉහළ යැමයි.

**විදේශ ණයවලින් වැඩි කොටසක් තවදුරටත් රාජ්‍ය අංශය සතුව පවතී.** මැදි හා දිගුකාලීන මුළු ණයවලින් සියයට 92 ක්ම රාජ්‍ය අංශයේ ණය වන අතර, ඉතිරිය පෞද්ගලික අංශය, රාජ්‍ය සංස්ථා සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් ණයවලින් සමන්විත වේ. රජයේ මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 86 ක් පමණ සහනදායී ණය වේ. ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන තත්ත්වයට ගමන් කරමින් පවතින බැවින් බහුපාර්ශ්වීය මූල්‍ය ආයතනවලින් සහනදායී ණය පහසුකම් ගැනීමේ හැකියාව සීමා වන අතර, මේ හේතුවෙන් රජයට සිය සංවර්ධන ව්‍යාපෘතීන් මූල්‍යනය කිරීම සඳහා වාණිජමය ණය ගැනීමට සිදුවී ඇත. කෙසේ වුවත්, අඩු ණය අවදානමක් සහිතව සිය වාණිජමය ණය තොගය පවත්වා ගැනීමට රජය සමත්වී සිටී.

## විදේශ ණය සේවාකරණ ගෙවීම්

**විදේශ ණය සේවාකරණ ගෙවීම්වලට අදාළ ණය වාරික සහ පොලී ගෙවීම් ප්‍රමාණය, භාණ්ඩ හා සේවා අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස 2007 වසරේ වාර්තා වූ සියයට 13.1 ක සිට 2008 වසරේ දී සියයට 15 ක් දක්වා වර්ධනය විය.** එ.ජ.ඩොලර්වලින් ගත්කළ ණය සේවාකරණ ගෙවීම් සියයට 23.8 කින් වර්ධනය විය. සුනාමි ව්‍යසනය හේතුවෙන් ලබාදුන් ණය ගෙවීම් පමාකිරීම අවසන්ව 2006 වසරේ සිට නැවතත් අඛණ්ඩව ණය ගෙවීම ආරම්භ කිරීම හේතුවෙන් සහ රජය ලබාගත් වාණිජ ණය පියවීම්, රටෙහි විදේශ ණය සේවා ගෙවීම් එ.ජ.ඩොලර්වලින් සැලකූ විට ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතු විය. විදේශ ණය ගෙවීමට රජය

**5.12 සංඛ්‍යා සටහන**

**විදේශ ණය සේවාකරණ ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2004 | 2005 | 2006 | 2007 | 2008 (අ) | රුපියල් දශ ලක්ෂ 2004 | 2005 | 2006 | 2007 | 2008 (අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ණය සේවා ගෙවීම් | 843 | 623 | 1,080 | 1,232 | 1,525 | 85,318 | 62,577 | 112,670 | 136,521 | 165,511 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 594 | 419 | 759 | 791 | 1,075 | 59,990 | 42,075 | 79,227 | 87,731 | 116,702 |
| (i) ජා. මූ. අරමුදලට | 107 | 39 | 144 | 5 | 77 | 10,718 | 3,902 | 15,276 | 789 | 8,582 |
| (ii) අනෙකුත් | 487 | 380 | 615 | 786 | 998 | 49,272 | 38,173 | 63,952 | 86,942 | 108,120 |
| 1.2 පොලී ගෙවීම් | 249 | 204 | 321 | 441 | 450 | 25,328 | 20,502 | 33,443 | 48,790 | 48,809 |
| (i) ජා. මූ. අරමුදලට | 10 | 10 | 14 | 14 | 11 | 988 | 973 | 1,452 | 1,509 | 1,173 |
| (ii) අනෙකුත් | 240 | 194 | 307 | 427 | 440 | 24,340 | 19,530 | 31,991 | 47,281 | 47,636 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයන හා සේවාවන්ගේ ඉපැයීම් | 7,284 | 7,887 | 8,508 | 9,415 | 10,140 | 738,714 | 793,153 | 885,380 | 1,041,932 | 1,098,376 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා, ආදායම් හා පෞද්ගලික සංක්‍රාම | 9,004 | 9,891 | 10,980 | 12,365 | 13,026 | 912,817 | 994,751 | 1,142,515 | 1,368,959 | 1,411,335 |
| 4. ණය සේවා අනුපාතිකය (ආ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 11.6 | 7.9 | 12.7 | 13.1 | 15.0 | 11.5 | 7.9 | 12.7 | 13.1 | 15.1 |
| (ii) ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර | 10.0 | 7.3 | 10.8 | 12.9 | 14.2 | 10.0 | 7.3 | 10.8 | 12.9 | 14.2 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 9.4 | 6.3 | 9.8 | 10.0 | 11.7 | 9.3 | 6.3 | 9.9 | 10.0 | 11.7 |
| (ii) ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර | 8.1 | 5.8 | 8.4 | 9.8 | 11.0 | 8.1 | 5.8 | 8.4 | 9.8 | 11.0 |
| 5. රජයේ ණය සේවා ගෙවීම් | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවා ගෙවීම් (ඇ) | 484 | 268 | 610 | 813 | 1,066 | 48,952 | 26,927 | 63,368 | 89,924 | 115,508 |
| 5.2 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 57.4 | 43.0 | 56.4 | 66.0 | 69.9 | 57.4 | 43.0 | 56.2 | 65.9 | 69.8 |

(අ) තාවකාලික

(ආ) වසර තුළ විනිමය අනුපාතිකයෙහි සිදු වූ වෙනස්වීම් හේතුවෙන් රුපියල් වටිනාකම හා එ.ජ.ඩොලර් වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගත් කල ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

(ඇ) ජා.මූ.අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දක්වන හැකියාව, එනම් ණය සේවා අනුපාතිකය තවමත් සැළකිය යුතු ආකාරයෙන් හිතකර ලෙස පවතිනුයේ දීර්ඝ ගෙවුම් කාලයක් සහිත ඉහළ ප්‍රමාණයක පවතින සහනදායි ණය මෙන්ම, භාණ්ඩ හා සේවා අපනයන ආදායමෙහි වූ යහපත් වර්ධනය හේතුවෙනි.

## 5.7 විනිමය අනුපාතික ක්‍රම සහ විනිමය අනුපාතිකයෙහි වෙනස්වීම්

ගෝලීය මුදල් වෙළෙඳපොළෙහි පැවති පෙර නොවූ විරූ ඉහළ උච්ඡාවචනයන් මධ්‍යයේ විනිමය අනුපාතිකයේ ස්ථාවරත්වය පවත්වා ගැනීම කෙරෙහි 2008 වසරේ මහ බැංකු විනිමය අනුපාතික ප්‍රතිපත්ති යොමුවී තිබුණි. මෙහිදී විදේශීය තරගකාරිත්වය පවත්වා ගැනීම සඳහා රුපියල ක්‍රමික අවප්‍රමාණය වීමකට ඉඩ සැලසුණි. ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්වෛරීත්ව ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සාර්ථක වීමත් සමඟ, 2007 ඔක්තෝබර් මස එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල් 114 ක් ව පැවැති රුපියලෙහි අගය 2008 මුල් භාගයේ දී ක්‍රමිකව අධිප්‍රමාණය වී 2008 මාර්තු මස වනවිට රුපියල් 107 ක් විය. නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශ හිමිකාරිත්ව සීමාව සියයට 5 සිට සියයට 10 තෙක් 2007 දෙසැම්බර් මස දී ඉහළ දැමීම සහ 2008 මුල් භාගය තුළ දී ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව එ.ජ.ඩොලරය දුර්වලවීම නිසා රුපියල අධිප්‍රමාණය වීමේ ස්වභාවය තවදුරටත් ශක්තිමත් විය. 2008 මැයි මාසයේ දී විදේශීය ආයෝජකයින් සඳහා භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ, නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත්වලින් සියයට 10 දක්වා ආයෝජනය කිරීමට විවෘත කිරීම නිසා රුපියල තවදුරටත් අධිප්‍රමාණය වීමට පීඩනයක් ඇති විය.

විදේශ විනිමය වෙළෙඳපොළ අධික ලෙස උච්ඡාවචනය වීම අවම කිරීම සහ රුපියල දැඩිව අධිප්‍රමාණය වීමෙන් අපනයන අංශයේ තරගකාරිත්වයට අහිතකර බලපෑමක් සිදු නොවීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය සංචිත මට්ටම ද ශක්තිමත් කරමින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය මිලදී ගන්නා ලදී. ඒ අනුව විනිමය අනුපාතිකය එ.ජ.ඩොලරයට එරෙහිව 108 ක පමණ මට්ටමේ පවත්වා ගැනීම සඳහා වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත් වීම ඉවහල් වූ අතර, ඔක්තෝබර් මස අවසානය වන විට දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 622 ක් මිලදී ගන්නා ලදී. ගෝලීය මූල්‍ය අර්බුදය උග්‍ර වීමත් සමඟ, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වැනි කෙටිකාලීන ආයෝජනයන් විදේශ ආයෝජකයින් විසින් නැවත සියරට ගෙනයාම හේතුවෙන් විදේශ විනිමය ගෙවීම් මෙන්ම ඛණිජ තෙල් සඳහා ගෙවීම් ද ඉහළයාම හේතුවෙන් 2008 අවසාන කාර්තුවේ දී විනිමය අනුපාතිකය මත දැඩි පීඩනයක් ඇති වන්නට විය. තවද, අපනයන මිල ගණන් හි ශීඝ්‍ර පහළ වැටීම, අපනයන ඉල්ලුම අඩුවීම් සහ ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ගවලට එරෙහිව එ.ජ.ඩොලරය දැඩි ලෙස අධිප්‍රමාණය වීම යන ප්‍රවණතාවයන් සලකමින් එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල නිදහසේ චලනය වීමට යම් නම්‍යතාවයක් මහ බැංකුව විසින් ලබාදුන් අතර, වෙළෙඳපොළට මැදිහත්වීම තුළින් අධික උච්ඡාවචනය වැළැක්වීමට ද පියවර ගනු ලැබුණි. ඒ අනුව, 2008 අවසාන කාර්තුව තුළ දී මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,014 ක විදේශ විනිමය සැපයූ අතර, 2008 වසර තුළ මුළු විදේශ විනිමය සැපයුම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,532 ක් විය.

**5.11 රූප සටහන** — **විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම්**

**එ.ජ. ඩොලරයට එරෙහිව රුපියලේ අගය**




**සඵල විනිමය අනුපාත දර්ශක (2006=100) මුදල් වර්ග 24 පැස අනුව**



**5.13 සංඛ්‍යා සටහන** — **විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2006 | 2007 | 2008 | 2006 | 2007 | 2008 | 2007 | 2008 | 2007 | 2008 |
| යුරෝ | 141.58 | 160.27 | 159.45 | 130.63 | 151.63 | 159.32 | -11.66 | 0.51 | -13.85 | -4.82 |
| ඉන්දියානු රුපියල් | 2.44 | 2.77 | 2.36 | 2.30 | 2.69 | 2.52 | -11.83 | 17.54 | -14.42 | 6.73 |
| ජපන් යෙන් | 0.91 | 0.97 | 1.25 | 0.89 | 0.94 | 1.05 | -6.83 | -22.44 | -4.96 | -10.51 |
| බ්‍රිතාන්‍ය පවුම් | 211.29 | 217.15 | 163.28 | 191.53 | 221.46 | 200.73 | -2.70 | 32.99 | -13.51 | 10.33 |
| එක්සත් ජනපද ඩොලර් | 107.71 | 108.72 | 113.14 | 103.96 | 110.62 | 108.33 | -0.93 | -3.91 | -6.02 | 2.11 |
| විශේෂ ගැනුම් හිමිකම් | 162.03 | 171.57 | 174.27 | 153.00 | 169.37 | 171.24 | -5.56 | -1.55 | -9.66 | -1.10 |

| සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2006=100) | මාසික දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | මාසික දර්ශකය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2006 දෙසැ. | 2007 දෙසැ. | 2008 දෙසැ. | 2006 | 2007 | 2008 | 2007 | 2008 | 2007 | 2008 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 94.35 | 87.79 | 93.71 | 100.00 | 89.23 | 90.20 | -6.95 | 6.74 | -10.77 | 1.09 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 99.26 | 105.65 | 125.47 | 100.00 | 100.07 | 118.08 | 6.43 | 18.77 | 0.07 | 18.00 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාල විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. ඍණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩු වීම පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළෙඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදු කරන වෙළෙඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. ඍණ ලකුණින් අගය අඩු වීම පෙන්නුම් කරයි.

(ඇ) මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කර ගෙන ගණනය කර ඇත.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2007 වසරේ දී එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 0.93 කින් පමණ අවප්‍රමාණය වූ රුපියල 2008 වසර අවසානයේ දී සියයට 3.91 කින් පමණ අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල, බ්‍රිතාන්‍ය පවුමට (සියයට 32.99) සහ ඉන්දියානු රුපියලට (සියයට 17.54) එරෙහිව සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය වූ අතර, ජපන් යෙන්වලට (සියයට 22.44) එරෙහිව අවප්‍රමාණය වී යුරෝවලට (සියයට 0.51) එරෙහිව බොහෝ දුරට මධ්‍යස්ථව පැවතිණි.

## නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය

2008 වර්ෂය තුළ දී, නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය 2007 වසරට වඩා ඉහළ අනුපාතිකයකින් අඛණ්ඩව අධිප්‍රමාණය විය. ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ නාමික අධිප්‍රමාණය වීමක් පෙන්නුම් කරමින්, මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම් ලත් පැස මත පදනම් ව 2007 වසරේ දී අවප්‍රමාණය වූ නාමික සඵල විනිමය අනුපාතිකය, 2008 වසරේ දී අධිප්‍රමාණය විය. මේ අතර, එක් එක් රටවල නාමික විනිමය අනුපාතිකයේ වෙනස්වීම්වලට අමතරව උද්ධමන අනුපාතයේ වෙනස්වීම් ගලපා සලකා බලනු ලබන මූර්ත සඵල විනිමය අනුපාතිකයද 2008 වසර තුළ දී සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය විය.

## දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනයන්

භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් ගනුදෙනු, ජාත්‍යන්තර වෙළෙඳාම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ විදේශීය සෘජු ආයෝජනවල ඉහළ වර්ධනය හේතුවෙන් 2008 වසර තුළ දී අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය ඉහළ ගියේය. ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළේ පැවැති ඉහළ පොලී අනුපාතිකයට සාපේක්ෂව දේශීය වෙළෙඳපොළේ පැවැති ඉහළ පොලී අනුපාතිකය සමග විනිමය

**5.12 රූප සටහන** — **කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්**



අනුපාතිකයේ සාපේක්ෂ ස්ථාවරත්වය හේතුවෙන් වසරේ මුල් භාගය තුළ දේශීය භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙළෙඳපොළවලට විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමට හැකිවිය. කෙසේ වෙතත්, වසර අවසානය කරා යාමේදී, ගෝලීය මූල්‍ය අර්බුදය උග්‍ර වීමත් සමඟ කෙටිකාලීන ආයෝජනයන් නැවත ඉවත්කර ගැනීම සහ රුපියල තවදුරටත් අවප්‍රමාණය වේයැයි අපේක්ෂාව නිසා විනිමය අනුපාතිකයේ උච්ඡාවචනයන් වැළැක්වීමට සහ විදේශ විනිමය වෙළෙඳපොළේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා සුපරික්ෂාකාරී සහ ආරක්ෂිත පියවරයන් අනුගමනය කිරීමට රජයට සිදුවිය. මෙම පියවරයන් විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රියාකාරිත්වය හීන කිරීමටද යම් තාක් දුරකට හේතුවිය.

**විනිමය අනුපාතිකයේ තියුණු උච්ඡාවචනයන් වැළැක්වීම සඳහා වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතුවලට විනිමය අවශෝෂණය කිරීමෙන් සහ සැපයීමෙන් යන දෙඅංශයෙන්ම මැදිහත් විය.** 2008 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 656 ක් අන්තර් බැංකු වෙළෙඳපොළෙන් අවශෝෂණය කිරීමෙන් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,532 ක විදේශ විනිමය සැපයීමෙන් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2007 වසරේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 123 ක ශුද්ධ සැපයීම් සමඟ සැසඳීමේ දී 2008 වසරේ දී ශුද්ධ සැපයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 876 ක් විය.